{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved }

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අ.පො.ස. උසස් පෙළ පෙරහුරු ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2026
க.பொ.த. உ/த முன்னோடி மாதிரி வினாப் பத்திரம் - 2026
G.C.E. A/L Pre-Model Model Question Paper - 2026

බෞද්ධ ශිෂ්ටාචාරය - I
பௌத்த நாகரீகம் - I
Buddhist Civilization - I

45 | S | I

කාලය : පැය 02
நேரம் : 02 மணித்தியாலம்
Time : 02 Hours

- **සියලු** ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබගේ **විභාග අංකය** ලියන්න.
- පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරාගෙන එය **පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) යොදා දක්වන්න.

1. බුදුසමය වර්ණ ධර්ම සංකල්පය ප්‍රතික්ෂේප කරමින් මානව සංහතියේ ඒකත්වය සටහන් කිරීම සඳහා විවිධ සාධක හඳුන්වා දෙයි. එම සාධක අතරින් ජීව විද්‍යාත්මක සාධක හඳුනාගත හැකි සූත්‍රයකි.
   1) වසල සූත්‍රය
   2) අම්බට්ඨ සූත්‍රය
   3) චංකි සූත්‍රය
   4) වාසෙට්ඨ සූත්‍රය
   5) අග්ගඤ්ඤ සූත්‍රය

2. බමුණන් පුද්ගලයාගේ ජීවිතය අවධි හතරකට බෙදා දක්වන ලද අතර, පහත තොරතුරුවලින් ගෘහස්ථ ආශ්‍රමය පිළිබඳ **නොකියවෙන්නේ**,
   1) උපනයන කර්මය සිදු කිරීම යි.
   2) පිරිමි දරුවෙක් ප්‍රාර්ථනා කිරීම යි.
   3) පස්කම් සැප විඳීම යි.
   4) ගර්භදාන සංස්කාරය සිදුකිරීම යි.
   5) කුලයට ගැළපෙන විවාහයක් කර ගැනීම යි.

3. 'මේ කාරණය මෙසේ යැයි මට අදහසක් නැත. මේ කාරණය එසේ ම යැයි ද මට අදහසක් නැත. මේ කාරණය වෙන සැටියකින් යැයි ද මට අදහසක් නැත...' යනාදී වශයෙන් දැක්වූ ආගමික දර්ශනය
   1) නියතිවාදය යි.
   2) සංසාර ශුද්ධිවාදය යි.
   3) පුබ්බේකතහේතුවාදය යි.
   4) සංසයවාදය යි.
   5) භෞතිකවාදය යි.

4. බුද්ධකාලීන භාරතයේ පැවති පාලන තන්ත්‍රයන් හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
   A. පූර්ණ ඒකාධිපති බලතල සහිත පාලන ක්‍රමයක් ක්‍රියාත්මක වීම.
   B. ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල විමධ්‍යගත වීම.
   C. යුවරජ, පුරෝහිත, අධිකරණ නායක, සේනාධිපති මගින් පාලන කටයුතු කරගෙන යෑම.
   D. දුර්වල රාජ්‍යවල පාලකයින් පරදවා තම බලය පුළුල් කර ගැනීම.
   E. සාම්ප්‍රදායික ගෝත්‍රික පාලන ක්‍රමයේ විකාශයක් ලෙස හඳුනාගත හැකිවීම.

   මේ අතරින් රාජාණ්ඩු පාලන ක්‍රමය සමග ගැළපෙන නිවැරදි ප්‍රකාශ වන්නේ,
   1) A, B හා C
   2) A, B හා D
   3) A, C හා D
   4) B, C හා D
   5) C, D හා E

5. බ්‍රාහ්මණ සමාජය තුළ කාන්තාවට හිමි වූ සමාජ තත්ත්වය සම්බන්ධයෙන් **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
   1) ස්වාමියා සමඟ එක්ව ආගමික වතාවත්වල නිරත විය හැකි ය.
   2) සති පූජාව චාරිත්‍රයක් ලෙස මිස දිවි පිදීමක් ලෙස නොසැලකී ය.
   3) වැන්දඹුවන් ජීවිතාන්තය දක්වා ම හුදෙකලා වාසයට යොමු විය යුතු ය.
   4) ස්ත්‍රිය බාල වියේ දී දෙමාපියන් යටතේ ජීවත් විය යුතු ය.
   5) විවාහය සම්බන්ධයෙන් කිසිදු ස්වාධීන තීරණයක් ගැනීමට අයිතියක් නැත.

6. බුද්ධකාලීන භාරතීය සමාජය තුළ දක්නට ලැබුණු නව ආගමික ප්‍රවණතාවක් වූයේ, බ්‍රාහ්මණ සම්ප්‍රදාය අභිබවා ශ්‍රමණ සම්ප්‍රදාය වඩාත් ජනප්‍රිය වීමයි. එකී ශ්‍රමණ සම්ප්‍රදායේ අනන්‍ය ලක්ෂණයක් ලෙස හඳුනාගත හැක්කේ,
   1) අනගාරිකත්වය ප්‍රතික්ෂේප කර අගාරික දිවියකට පිවිසීම යි.
   2) ඥාන මාර්ගය ප්‍රතික්ෂේප කර කර්ම මාර්ගයට අවතීර්ණ වීම යි.
   3) බාහිර පුද පූජා ක්‍රම මගින් විමුක්තිය අපේක්ෂා කිරීම යි.
   4) ජන්මීය සාධක පදනම් කරගෙන පුද්ගලයා වර්ග කර දැක්වීම යි.
   5) වේදය පරම සත්‍ය ලෙස නොපිළිගැනීම යි.

7. බුද්ධකාලීන භාරතීය පාලකයන් හා බුදුරජාණන් වහන්සේ අතර සම්බන්ධතාව ප්‍රකට වන ප්‍රකාශ කිහිපයක් පහතින් දක්වා ඇත.
   A. බුදුරජාණන් වහන්සේ විසින් තිරෝකුඩ්ඩ සූත්‍රය දේශනා කිරීම.
   B. ප්‍රථම ආරාම පූජාව ලෙස වේළුවනාරාමය සඟ සතු කොට පූජා කිරීම.
   C. බුදුරජාණන් වහන්සේ විසින් අදත්තාදාන පාරාජිකාව අනුදැන වදාරා තිබීම.
   D. උපෝසථ කර්මය නම් චාරිත්‍රය බුද්ධ ශ්‍රාවකයන් උදෙසා හඳුන්වා දීම.
   E. බුදුරජාණන් වහන්සේ ප්‍රධාන භික්ෂු සංඝයාට අසදෘස මහාදානය පූජා කිරීම.

   ඉහත ප්‍රකාශ අතරින් බිම්බිසාර රජු හා බුදුරජාණන් වහන්සේ අතර සම්බන්ධය තහවුරු වන ප්‍රකාශ ඇතුළත් නිවැරදි වරණය කුමක් ද?
   1) A පමණි.
   2) A සහ B පමණි.
   3) A, B සහ C පමණි.
   4) A, B, C සහ D පමණි.
   5) A, B, C, D, E යන සියල්ල ම.

8. ක්‍රි.පූ. 6 වන සියවසේ භාරතය ඉතා දියුණු වාණිජකරණයකට හා නාගරීකරණයකට ලක් වූ අතර පහත කරුණුවලින් නාගරික ලක්ෂණයක් ලෙස හඳුනාගත හැක්කේ,
   1) සමහර පාලකයින් 'ඕදන' යන්න නම්වලට එක්කර ගැනීම.
   2) සමාජය තුළ විවිධ දුරාචාර සහ අසද්ධර්ම පැවතීම.
   3) මගධ කෙත්යායට අනුව චීවරය සකස් කර ගැනීම.
   4) ශාක්‍ය කෝලිය වංශිකයින් අතර ජල අරගලයක් හටගැනීම.
   5) කසීභාරද්වාජ බමුණා ගොවිතැන ජීවනෝපාය කර ගැනීම.

9. බෙදුයෙන් දහම් කඳ
   බජනය කෙළෙන් ගුණ කඳ
   බග දහමින් සසඳ
   .....
   ඉහත කවියෙන් කියවෙන බුදුගුණය වන්නේ,
   1) බුද්ධ බුදු ගුණය යි.
   2) භගවා බුදු ගුණය යි.
   3) සම්මා සම්බුද්ධ බුදු ගුණය යි.
   4) ලෝකවිදූ බුදු ගුණය යි.
   5) සුගත බුදු ගුණය යි.

10. බුදුරජාණන් වහන්සේ සුවිශේෂී ගුණවලින් යුක්ත ශාස්තෘවරයෙක් විය. උන්වහන්සේ අසදෘස මහා දානය මෙන් ම, දුගී දුප්පත් දාසයන් වෙතින් ලැබුණු රළු ආහාර දානය ඉවසීමෙන් ද, සේල ආදී පඬිවරුන්ගේ ද, කොසොල් ආදී රජවරුන්ගේ ද, දේව බ්‍රහ්ම ආදී විවිධ පිරිසගේ ප්‍රශංසා ද, සුන්දරී පරිබ්‍රාජිකාව හා දේවදත්ත වැන්නවුන්ගේ නින්දා අපහාස ද, ඉවසීම තුළ ප්‍රකට වන්නේ, බුදුරජාණන් වහන්සේගේ,
   1) ආගමික සහනශීලීත්වය යි.
   2) මහා ප්‍රඥාව යි.
   3) තාදි ගුණය යි.
   4) පද්මාකාර ජීවිතය යි.
   5) නිදහස් චින්තනය යි.

11. 'ලෝකයේ සුප්‍රසිද්ධ ආගම්වලින් මා බුදු දහමට, විශේෂයෙන් මුල් බුදු දහමට කැමැති වන්නේ එය කිසිවකු නොපෙළන බැවිනි.' මෙම ප්‍රකාශය කරන ලද්දේ,
   1) ඇල්බට් අයින්ස්ටයින් ය.
   2) මහාචාර්ය ලක්ෂ්මී නරසු ය.
   3) බර්ට්‍රන්ඩ් රසල් ය.
   4) මහාචාර්ය සෝණ්ඩර්ස් ය.
   5) එඩ්වින් ආර්නෝල්ඩ් ය.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

12. පහත දැක්වෙන්නේ බුද්ධකාලීන ශ්‍රාවකයන් වහන්සේලා විසින් දේශනා කරන ලද සූත්‍ර කිහිපයකි.

A. සංගීති සූත්‍රය
B. මහා නිධාන සූත්‍රය
C. දසුත්තර සූත්‍රය
D. ගුලිස්සානි සූත්‍රය
E. වේළුද්වාර සූත්‍රය

මේ අතරින් සැරියුත් හිමියන් විසින් සරල ලෙස කරුණු විස්තර කරමින් දේශනා කරන ලද සූත්‍ර වන්නේ,

1) A, B, C
2) A, C, D
3) B, C, E
4) B, D, E
5) C, D, E

13. බුදුදහම පුද්ගලයාගේ ශක්තිය, ස්වාමීත්වය මෙන් ම ස්වාධීනත්වය ද අගය කරනු ලබයි. එහි දී පුද්ගල ශක්තිය අර්ථවත් කෙරෙන 'ථාම ධාතු' යනු,

1) වීර්යය බලවත් වීම යි.
2) ස්ථාවර වීර්යයකට පැමිණීම යි.
3) උපක්‍රම යෙදීම යි.
4) ක්‍රියාවක් ආරම්භ කිරීම යි.
5) වීර්යය පවත්වාගෙන යෑම යි.

14. යහපත් රාජ්‍ය පාලනයක් සකසා ගැනීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් රාජ්‍ය පාලන මූලධර්ම රාශියක් දේශනා කොට ඇත. එහි දී පහත සඳහන් මූලධර්ම අතරින් දසරාජ ධර්ම හා සතර සංග්‍රහ වස්තු යන දෙකෙහි ම සඳහන් වන කාරණයක් වන්නේ,

1) විරුද්ධ නොවීම යි.
2) පරිත්‍යාගය යි.
3) සීලය යි.
4) අර්ථචර්යාව යි.
5) දානය යි.

15. සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ විග්‍රහය ඇතුළත්වන අග්ගඤ්ඤ සූත්‍ර දේශනාවට අනුව මානව සමාජය පරිණාමය වීමේ දී, ක්‍රමවත් පරිපාලනයක් ඇති කිරීමට මුල් වූයේ,

1) මහජන මතය යි.
2) තෘෂ්ණාව යි.
3) දේවභාෂිතය යි.
4) මෛථුන සේවනය යි.
5) දරිද්‍රතාව යි.

16. යහපත් රාජ්‍ය පාලනයක් ගෙනයාම සඳහා ප්‍රජාව විසින් ද ඉටු කළ යුතු වගකීම් රාශියක් ඇත. ඒ අනුව 'අම්හාකං සාලීනං භාගං අනුප්පදස්සාමි' යනුවෙන් බදු ගෙවීම පිළිබඳව ජනතාව පොරොන්දු වී ඇති බව සඳහන් වන්නේ,

1) කූටදන්ත සූත්‍රය තුළ ය.
2) මහා පරිනිබ්බාන සූත්‍රය තුළ ය.
3) අග්ගඤ්ඤ සූත්‍රය තුළ ය.
4) සංගහවත්ථු සූත්‍රය තුළ ය.
5) රජ්ජ සූත්‍රය තුළ ය.

17. හොඳ නරක විනිශ්චය කිරීමෙහි ලා භාවිත බෞද්ධ නිර්ණායක රාශියක් බුදු දහමේ විස්තර වන අතර, එකී සෑම නිර්ණායකට ම පාහේ ප්‍රධාන වශයෙන් ම පදනම් කරගෙන ඇත්තේ,

1) කර්මය සහ විපාකය යි.
2) කය සහ වචනය යි.
3) පුද්ගලයා සහ සමාජය යි.
4) නිත්‍ය සහ අනිත්‍ය බව යි.
5) චේතනාව සහ විපාකය යි.

18. පුද්ගලයා කරනු ලබන ක්‍රියා කුසල ක්‍රියා හා අකුසල ක්‍රියා වශයෙන් දෙයාකාර වේ. එවැනි කුසලාකුසල ගණයට වැටෙන ක්‍රියා කීපයක් පහත දැක්වේ.

A. වෙය්‍යාවච්ච
B. පරදාරංච
C. පේසුඤ්ඤ
D. අපචායන
E. දිට්ඨිජුකම්ම
F. මිච්ඡාදිට්ඨි

ඉහත කරුණු අතරින් අකුසල් වශයෙන් සැලකිය හැකි කරුණුවලට අදාළ අක්ෂර සහිත නිවැරදි වරණය තෝරන්න.

1) A, B, C
2) B, C, E
3) B, C, F
4) C, E, F
5) D, E, F

19. බෞද්ධ ප්‍රතිපදාව අනුගමනය කිරීමටත්, ඥාන ප්‍රතිලාභය පිණිසත්, පුද්ගලයා පොළඹවන මනෝභාවයක් ලෙස ශ්‍රද්ධාව හඳුන්වා දිය හැකි ය. එය අමූලිකා හා ආකාරවතී යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. ඒ අතරින් ආකාරවතී ශ්‍රද්ධාව යනු,

1) අවෙච්චපසාදය යි.
2) අන්ධවේණූපමාව යි.
3) භක්තිය යි.
4) සන්තෘෂ්ඨිතාව යි.
5) අප්පමඤ්ඤාව යි.

20. ඉන්ද්‍රිය ප්‍රීණනයෙන් ඇලී ගැලී ඌණතාවෙන් මිරිකෙමින් තණ්හාවේ දාසභාවයට පත්ව සිටින පෘථග්ජනයින්ට ඉන් මිදීමට නම් ..... වෙන් විය යුතු ය.

1) සුභරතාවෙන්
2) අල්ප කෘත්‍යතාවෙන්
3) මහිච්ඡතාවෙන්
4) බහුකිච්ඡතාවෙන්
5) ඉන්ද්‍රිය සංවරයෙන්

21. බුදු සමය ස්වාභාවික පරිසරය විෂයෙහි සුහද මිත්‍රශීලි අවධානයක් යොමු කර ඇති දහමක් බැවින් පරිසර සංරක්ෂණයේ ඇති වැදගත්කම ද අවධාරණය කරයි. පහත සඳහන් ප්‍රකාශ අතරින් බෞද්ධ පාරිසරික සංරක්ෂණ සංකල්පය වඩාත් හොඳින් ප්‍රකට වන ප්‍රකාශය කුමක් ද?

1) වප්මඟුල් දින සිදුහත් කුමරු දඹරුක් සෙවණේ දී ආනාපානසති භාවනාව වැඩීම.
2) ගිහිගෙය අතහැර යන සිදුහත් කුමරු නේරංජරා නදී තීරයේ දී පැවිදිවීම.
3) බුදුරජාණන් වහන්සේ ඉසිපතන මිගදායේ දී පළමු වස් කාලය ගත කිරීම.
4) සියලු ආකාරයේ පැළවන බීජ සිඳීම භික්ෂූන්ට ආපත්ති ලෙස විනයෙහි දක්වා තිබීම.
5) බුදුරජාණන් වහන්සේ ජීවක අඹ වනයේ දී සාමඤ්ඤඵල සූත්‍රය දේශනා කිරීම.

22. ධනෝපායනය, ධන පරිහරණය පිළිබඳව උපදෙස් දක්වා ඇති ප්‍රධාන බෞද්ධ මූලාශ්‍රයක් ලෙස 'රාසියගාමිණී සූත්‍රය' පෙන්වා දිය හැකි ය. එහි ඊට අදාළ ප්‍රධාන උපදෙස් හතරක් දක්වා ඇති අතර, එම උපදෙස් අතරට අයත් **නොවන** කරුණකි,

1) ඥාතීන්ට සංග්‍රහ කිරීම.
2) තමා සැපවත්වීම.
3) පරිත්‍යාග කිරීම.
4) දැහැමින් ඉපයීම.
5) ගිජුකමින් තොරව පරිහරණය කිරීම.

23. ධන සම්පත් කළමනාකරණය පිළිබඳ වටිනා ධර්ම උපදේශයක් සපයන සිගාලෝවාද සූත්‍රයේ 'ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය...' යන ගාථාවට අනුව යමෙකු තමා උපයන ධනයෙන් ආයෝජනය කළ යුත්තේ කොටස්

1)එකකි. 2) දෙකකි. 3) තුනකි. 4) හතරකි. 5)පහකි.

24. භෞතික සම්පත් මනාව කළමනාකරණය කර ගැනීම සඳහා ඉගැන්වීම් කිහිපයක් බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත. පහත දැක්වෙන්නේ ඒ අතරින් කිහිපයකි.

A. දිරූ දේ ප්‍රතිසංස්කරණය කිරීම.
B. නැසුණු සම්පත් ඉපයීම.
C. උපයන සම්පත් ආරක්ෂා කිරීම.
D. පරිභෝජනයේ සීමා දැන සිටීම.
E. සම්පත් භාවිතයෙන් වැරදි දේට නොයෑම.

ඉහත සඳහන් කරුණුවලින් අංගුත්තර නිකායේ කුල සූත්‍රයට අයත් කරුණු වන්නේ,

1) A, B, C 2) A, B, D 3) B, C, D 4) B, C, E 5) C, D, E

25. පුද්ගලයා ලබන ප්‍රධාන ගිහි සැප හතරක් බුදුදහමේ පෙන්වා දෙයි. පහත දැක්වෙන්නේ එම සැප වර්ග පිළිබඳ අර්ථකථනයන් ය.

A. දෙමාපිය අඹු දරු ජනයා සුඛිත කරවීම.
B. ධාර්මිකව උපයාගත් ධනයක් ඇතැයි සතුටක් සොම්නසක් ඇති කර ගැනීම.
C. මහණ බමුණන් විෂයෙහි දක්ෂිණාව පිහිටුවීම.
D. කිසිදු ආකාරයක ණයක් නැතැයි සිතා සතුටු වීම.
E. මිතුරු යහළුවන් සැපවත් කිරීම විෂයෙහි තම ධනය යෙදවීම.

මෙම කරුණු අතරින් භෝග සුඛය පිළිබඳ තොරතුරු හඳුනාගත හැක්කේ,

1) A, B, C 2) A, B, E 3) A, C, E
4) B, C, E 5) B, C, D

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

26. සිගාලෝවාද සූත්‍රයේ සමාජ කණ්ඩායම් හයකට අදාළ යුතුකම් 61ක් පෙන්වා දී ඇත. එහි එන 'පවින් වැළැක්වීම' යන යුතුකම ඉටුකළ යුතු සමාජ කණ්ඩායම් දෙක වන්නේ,
    1) දෙමාපියන් සහ පැවිද්දන් ය.
    2) දෙමාපියන් සහ ගුරුවරුන් ය.
    3) ගුරුවරුන් සහ පැවිද්දන් ය.
    4) මිත්‍රයන් සහ ගුරුවරුන් ය.
    5) දෙමාපියන් සහ මිත්‍රයින් ය.

27. අගාරික ජීවිතය සංවර්ධනය සඳහා උපදෙස් සපයන සූත්‍රයක් ලෙස මහා මංගල සූත්‍රය පෙන්වා දිය හැකිය. එහි එන 'විරජං' යනු,
    1) පාපයෙන් වැළකීම යි.
    2) ලද දෙයින් සතුටු වීම යි.
    3) ශෝක රහිත බව යි.
    4) සුදුස්සාට ගරු කිරීම යි.
    5) කෙලෙස් රහිත බව යි.

28. 'න පරේසං විලෝමානි න පරේසං කතාකතං' යන ධම්මපද ගාථා පාඨයට වඩාත් ගැළපෙන වරණය කුමක් ද?
    1) පවිටු මිතුරන් ඇසුරු නොකළ යුතු ය. උතුම් මිනිසුන් ඇසුරු කළ යුතු ය.
    2) තමාට තමා ප්‍රිය නම් තමා තමාව ම මනාව රැක ගත යුතු ය.
    3) අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතු ය.
    4) අනර්ථ සිදු කරන පදවලින් යුතු වචන දාහක් වුවත් උතුම් නැත.
    5) ක්‍රෝධ කරන්නා ක්‍රෝධ නොකිරීමෙන් ද, අසත්පුරුෂයා සත්පුරුෂකමින් ද දිනිය යුතු ය.

29. බුදුරජාණන් වහන්සේ තම ප්‍රථම ධර්මදූත පිරිස අමතා දේශනා කරන ලද අවවාදයෙහි එන 'මා ඒකේන ද්වේ අගමිත්ථ, දේසේථ භික්ඛවේ ධම්මං ආදී කල්‍යාණං, මජ්ඣේ කල්‍යාණං, පරියෝසාන කල්‍යාණං...'
යන පාඨයේ අර්ථය සමග වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
    1) 'මහණෙනි, බොහෝ දෙවි මිනිසුන්ගේ හිතසුව පිණිස චාරිකාවේ හැසිරෙන්න.'
    2) 'මහණෙනි, ගම් නියම් ගම්හි චාරිකාවේ හැසිරෙමින් දහම් දෙසන්න.'
    3) 'මහණෙනි, ප්‍රජානුකම්පාවෙන් යුතුව දුෂ්කරතා විඳගෙන දහම් චාරිකාවේ යෙදෙන්න.'
    4) 'මහණෙනි, දෙදෙනෙක් එක මග නොයන්න. මුල මැද අග පරිසමාප්තව දහම් දෙසන්න.'
    5) 'මහණෙනි, ධර්මය සහ විනය මැනවින් සුරක්ෂිත වන පරිදි කටයුතු කරන්න.'

30. තම ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ විශේෂ හැකියාවන් අගය කරමින් බුදුරජාණන් වහන්සේ අග තනතුරු ප්‍රදානය කිරීමට අදාළ නිදසුන් කිහිපයක් පහත දැක්වේ. ඒ අතරින් නිවැරදි ලෙස දක්වා ඇති තනතුරු නාමයන් හඳුනාගෙන ඊට අදාළ පිළිතුර තෝරන්න.
    A. සැරියුත් හිමි - බහුශ්‍රැත භික්ෂූන් අතර අග තනතුර
    B. මහා කාශ්‍යප හිමි - ධූතාංගධාරී භික්ෂූන් අතර අග තනතුර
    C. ආනන්ද හිමි - ප්‍රඥාවන්ත භික්ෂූන් අතර අග තනතුර
    D. මුගලන් හිමි - ඍද්ධිමත් භික්ෂූන් අතර අග තනතුර
    E. උපාලි හිමි - විනයධර භික්ෂූන් අතර අග තනතුර
    1) A, B, C
    2) A, C, E
    3) B, C, D
    4) B, C, E
    5) B, D, E

31. 'ඔබ සියලු දෙනා ම එක්රැස් වී බ්‍රහ්ම චරියාවෙහි චිරස්ථිතිය පිණිස, අර්ථයෙන් අර්ථය, ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනය සංගායනා කරන්න වාද නොකරන්න...' යනුවෙන් පාසාදික සූත්‍රයේ එන බුද්ධ වචනය සමඟ වඩාත් ගැළපෙන ප්‍රකාශය වන්නේ,
    1) බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේ දී ම ධර්ම සංගායනා සංවිධානය වී ඇති බවයි.
    2) ධර්ම සංගීති සංකල්පය බුදුරජාණන් වහන්සේ විසින් ම දේශනා කරන ලද්දක් බවයි.
    3) ධර්ම සංගායනාවක අවශ්‍යතාව භික්ෂූන් විසින් බුදුරජාණන් වහන්සේට පෙන්වා දී ඇති බවයි.
    4) බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව ධර්මය සංග්‍රහ කිරීමට උපදෙස් දී ඇති බවයි.
    5) දුසිල් භික්ෂූන් බුද්ධ කාලයේ දී ම සසුනින් නෙරපා දැමීමට කටයුතු කළ බවයි.

32. පළමු ධර්ම සංගායනාවේ දී භාණක පරම්පරාවලට වගකීම් පැවරීම සම්බන්ධ තොරතුරු පහතින් දක්වා ඇත.

A. දීඝ නිකාය - ආනන්ද මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුර
B. මජ්ඣිම නිකාය - සැරියුත් මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුර
C. සංයුත්ත නිකාය - මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුර
D. අංගුත්තර නිකාය - අනුරුද්ධ මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුර
E. බුද්දක නිකාය - උපාලි මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුර

ඉහත විස්තරයට අනුව වඩාත් නිවැරදි ම ගැළපීම සහිත පිළිතුර දැක්වෙන වරණය කුමක් ද?

1) A, B, C 2) A, C, D 3) B, C, D
4) B, D, E 5) C, D, E

33. භාරතීය බෞද්ධ ඉතිහාසය තුළ කීර්තිමත් පාලකයකු වූ ධර්මාශෝක රජු විසින් බුදුසමයේ සංවර්ධනය සහ ව්‍යාප්තිය උදෙසා ගන්නා ලද පියවර රාශියකි. පහත සඳහන් පිළිතුරු අතරින් ධර්මාශෝක රජුගේ ශාසනික සේවය සමඟ **නොගැළපෙන** පිළිතුර සහිත වරණය කුමක් ද?

1) බෞද්ධ වෙහෙර විහාර අසූහාරදහසක් කරවීම.
2) ධර්ම මහාමාත්‍යවරුන් පත් කර වගකීම් පැවරීම.
3) නව රට සසුන් පිහිටුවීමට කටයුතු කිරීම.
4) සාංචි ස්තූපය ඉදිකිරීමට කටයුතු කිරීම.
5) මධ්‍ය ආසියාවේ බුදුදහම ප්‍රචාරය කරවීම.

34. භාරතයේ පැවති විශ්වවිද්‍යාල කිහිපයක් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

A. තට්ටු නවයකින් හා මන්දිර තුනකින් යුතු පුස්තකාලයක් තිබී ඇත.
B. ප්‍රධාන දේශන ශාලාව විද්‍යාගෘහ නමින් හැඳින්විය.
C. භික්ෂූන් වහන්සේලා 6000ක් පමණ වසන සංඝාරාම සියයක් පමණ තිබී ඇත.
D. අධ්‍යයන කටයුතු භාර ආචාර්යවරුන් 108 දෙනෙක් සිට ඇත.
E. ධර්මපාල රජතුමා ප්‍රථම සංඝාරාමය ඉදිකොට ඇත.

ඉහත ප්‍රකාශවලින් වික්‍රමශීලා විශ්වවිද්‍යාලය පිළිබඳ පමණක් තොරතුරු කියැවෙන්නේ,

1) A, B, C 2) A, B, D 3) B, C, D
4) B, C, E 5) B, D, E

35. ප්‍රාග් බෞද්ධ ලංකාවේ වන්දනයට පාත්‍ර වූ දෙවි දේවතාවුන් අතරින් නුග ගසට හා තල් ගසට අධිගෘහිතව වාසය කරන ලද වෘක්ෂ දේවතාවන් දෙදෙනා වූයේ,

1) වෛශ්‍රවණ දෙවියන් හා කම්මාර දෙවියන් ය.
2) සමන් දෙවියන් හා ව්‍යාධ දෙවියන් ය.
3) සමන් දෙවියන් හා උපුල්වන් දෙවියන් ය.
4) වෛශ්‍රවණ දෙවියන් හා ව්‍යාධ දෙවියන් ය.
5) කම්මාර දෙවියන් හා උපුල්වන් දෙවියන් ය.

36. මහින්දාගමනයෙන් පසු බුදුදහමට අනුගතව රාජ්‍ය පාලනය කළ බොහෝ රජවරුන් තම උපදේශකත්වය සඳහා බෞද්ධ භික්ෂූන් පත් කර ගත්හ. එහි දී දුටුගැමුණු රජතුමාට උපදේශකත්වය ලබාදෙන ලද්දේ,

1) කාල බුද්ධරක්ඛිත හිමියන් ය. 2) සංඝමිත්‍ර හිමියන් ය.
3) ගෝධගත්තතිස්ස හිමියන් ය. 4) මහාතිස්ස හිමියන් ය.
5) කුපික්කලතිස්ස හිමියන් ය.

37. පහත සඳහන් ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශයක් **නොවන්නේ**,

1) දේවානම්පියතිස්ස රජතුමා නාගදීපයේ ජම්බුකෝල විහාරය කරවන ලදි.
2) වළගම්බා රජතුමා දක්ඛිණගිරි විහාරය කරවා පූජා කරන ලදි.
3) දුටුගැමුණු රජතුමා ලෝවාමහාප්‍රාසාද උපෝසථාගාරය කරවන ලදි.
4) මහසෙන් රජතුමා මහා විහාරයට එරෙහිව විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදි.
5) සංඝමිත්තා තෙරණිය වැඩමවා ගැනීමට අරිට්ඨ කුමරු ප්‍රධාන පිරිස යවන ලදි.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

38. ලක්දිව බිහිවූ ප්‍රමුඛ බෞද්ධ මධ්‍යස්ථාන දෙකක් සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A. විනය සංගායනාව පවත්වා සසුනේ සුරක්ෂිත භාවය තහවුරු කිරීම.

B. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සහ ත්‍රිපිටකයට අටුවා සම්පාදනය කිරීම.

C. බෝධිසත්ත්ව සංකල්පය ප්‍රධාන කරගත් නව දාර්ශනික සංකල්ප හඳුන්වාදීම.

D. දළදා වහන්සේ පිළිගෙන දළදා සංස්කෘතියක් ආරම්භ කිරීම.

E. භික්ෂුණීන් උදෙසා හත්ථාල්හක මෙහෙණවර ඉදිකිරීම.

ඉහත කරුණු අතරින් අභයගිරි සම්ප්‍රදායට අනන්‍ය ලක්ෂණ දෙකක් ලෙස හඳුනාගත හැක්කේ,

1) A හා B 2) B හා C 3) C හා D
4) C හා E 5) D හා E

39. මහින්දාගමනයෙන් අනතුරුව පුද්ගලයාගේ උපතේ සිට මරණය තෙක් ජීවිතයේ වැදගත් අවස්ථා හා බැඳුණු සිරිත් විරිත් රාශියක් ලාංකික සංස්කෘතිය තුළ හඳුනාගත හැකි ය. ඒ අතරින් අලුත උපන් දරුවෙකුගේ ආරක්ෂාව සම්බන්ධ කරගෙන සිදු කරනු ලබන ප්‍රධාන චාරිත්‍ර විධියක් ලෙස හඳුනාගත හැක්කේ,

1) දරුවාගේ ගෙලෙහි බුදුරුව සහිත මාලයක් පැළඳවීම.
2) අංගුලිමාල පිරිත දේශනා කර ආශීර්වාද කිරීම.
3) පංචායුධය, ධර්ම චක්‍රය, බෝපත්‍රය ආදී ආකෘති ගෙල පැළඳවීම.
4) තෙරුවන් වැඳ දෙවියන්ට පින් දී දරු උපත් අපේක්ෂා කිරීම.
5) ජයමංගල ගාථා ගායනා කරමින් සුභාශිංසනය පිරිනැමීම.

40. මංමාවත් ඉදිකිරීම, ගිලන්හල් තැනීම, ආරෝග්‍යශාලා ඉදි කිරීම, ලිං පොකුණු තැනීම යනා දී සත් කාර්යයන් තුළින් අර්ථවත් කෙරෙන්නේ,

1) පරෝපකාරය යි.
2) අවිහිංසාව යි.
3) අත්තම් ක්‍රමය යි.
4) ගිලානෝපස්ථානය යි.
5) ශාසන මාමකත්වය යි.

41. මියන්මාරයේ බුදුදහමේ ආරම්භය සහ ව්‍යාප්තිය පිළිබඳ සැලකීමේ දී ක්‍රි.ව. 11 වන සියවසට පෙර පේගු හා ..... රාජධානිවල බුදුදහම ඉතා සමෘද්ධිමත්ව පැවතී ඇත.

1) කමකුරා 2) හැං
3) ද්වාරවතී 4) පාපයෝම්
5) ථෙටෝන්

42. පහතින් දක්වා ඇති ප්‍රකාශ කියවා ඒ අතරින් තායි සංඝ සංවිධාන ව්‍යුහය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ ඇතුළත් අක්ෂර සහිත වර්ණය කුමක්දැ යි තෝරන්න.

A. සංඝරාජවරයා සංඝ සංවිධානයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

B. භික්ෂූන් අතරින් තෝරාගන්නා සංඝරාජවරයා රජු විසින් පත්කරනු ලබයි.

C. සංඝරාජවරයා ප්‍රධාන කරගත් සංඝ සංවිධානය කොටස් හතකින් යුක්ත වේ.

D. භික්ෂූන් හතළිස් පස්දෙනෙකුගෙන් සමන්විත උත්තරීතර සංඝ සභාවක් ක්‍රියාත්මක වේ.

E. බෞද්ධ වෙහෙර විහාර සියල්ල සංඝ සංවිධානය යටතේ පාලනය වෙයි.

1) A පමණි 2) A හා B පමණි
3) A, B හා C පමණි 4) A, B, C හා D පමණි
5) A, B, C, D, හා E යන සියල්ලම

43. ක්‍රි.ව. 250 දී ඉන්දියාවෙන් චීනයට වැඩම කරන ලද ධර්මාකර නම් භික්ෂූන් වහන්සේ විසින් විනය කටයුතු සඳහා ධවල අශ්වාරාමයේ සීමා මාලකයක් පිහිටුවමින් චීන බුදු සමයේ උන්නතිය වෙනුවෙන් සිදු කරන ලද ප්‍රධානතම කාර්යය,

1) විනය කර්ම සිදු කිරීම යි. 2) භික්ෂු සසුන ආරම්භ කිරීම යි.
3) භික්ෂුණී සසුන ආරම්භ කිරීම යි. 4) චීනය පුරා බුදුදහම ප්‍රචාරය කිරීම යි.
5) ත්‍රිපිටකය චීන බසට පරිවර්තනය කිරීම යි.

44. ක්‍රි.ව. 552 දී කොරියාවෙන් ජපානයට බුදුදහම හඳුන්වා දීමේ දී එරට පාලනය සමඟ සම්බන්ධව සිටි ප්‍රධාන ගෝත්‍ර දෙකක් බුදුදහම ප්‍රතික්ෂේප කරයි. එහි දී බුදුදහම පිළිගැනීමට කටයුතු කරන ලද්දේ,

1) මොනොනොබේ ගෝත්‍රය යි.
2) හෙයියන් ගෝත්‍රය යි.
3) නකතෝමි ගෝත්‍රය යි.
4) සමුරායි ගෝත්‍රය යි.
5) සෝගා ගෝත්‍රය යි.

45. සෑම වසරක ම දෙසැම්බර් 08 වන දින බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වය සිහිපත් කරමින් ජපන් සෙන් නිකායන් මහත් හරසරින් සමරනු ලබන උත්සවය වන්නේ,

1) හනමත්සුරි
2) හිගන්
3) බොන්
4) ජෝදෝ ඒ
5) නෙහෙන් ඒ

46. බුද්ධ ප්‍රතිමා කලාවේ ප්‍රධාන සම්ප්‍රදායන් තුළින් ඉස්මතු වන අනන්‍යතා ලක්ෂණ කිහිපයක් පහතින් දැක්වේ.

A. අත් සිරුරට ළංව පිහිටා තිබීම.
B. ශාක්‍ය සිංහ ලීලාව ඉස්මතු කිරීම.
C. නෙත් අඩවන් ය. තොල් සිහින් ය.
D. සමභංග ඍජු සිරුරකින් යුතුවීම.
E. හිසකෙස් ශෛලිගත ක්‍රමයට දැක්වීම.

ඉහත ලක්ෂණ අතරින් මථුරා සම්ප්‍රදායේ අනන්‍යතා ලක්ෂණ නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

1) A, B, C
2) A, C, D
3) B, C, D
4) B, D, E
5) C, D, E

47. පහත සඳහන් සාහිත්‍ය කෘති සහ එහි කතුවරයා නිවැරදිව දක්වා ඇති පිළිතුර සහිත වරණය කුමක් ද?

A. පූජාවලිය - දෙවන පැරකුම්බා රජු
B. කව්සිළුමිණ - බුද්ධපුත්‍ර හිමි
C. සද්ධර්මරත්නාවලිය -ධර්මසේන හිමි
D. බුදුගුණාලංකාරය - වීදාගම හිමි

1) A හා B
2) A හා C
3) B හා C
4) B හා D
5) C හා D

48. ලාංකේය ස්තූපයේ අංග අතරින්, ස්තූප ගර්භය මගින් අර්ථවත් කෙරෙන්නේ,

1) නවාංග ශාස්තෘ ශාසනය යි.
2) සත්තිස් බෝධි පාක්ෂික ධර්මය යි.
3) සුවාසූදහසක් ධර්මස්කන්ධය යි.
4) චතුරාර්ය සත්‍යය යි.
5) ත්‍රිවිධ රත්නය යි.

49. සඳකඩපහණ පිළිබඳ විවිධ උගතුන් ද මත පළ කොට ඇත. ඒ අනුව විනී විතාරණ මහතාගේ මතය වන්නේ,

1) සඳකඩපහණ චන්ද්‍ර සූර්ය දෙදෙනා පිළිබඳ විශ්වාසයට හා සශ්‍රීකත්වයට සම්බන්ධ බවයි.
2) බැතිමතුන්ගේ ආත්ම පූජාවෙන් කොටසක් සංකේතවත් කරයි.
3) සඳකඩපහණ ගොඩනැගිලි දොරටු සැරසීමට යොදාගත් උපායක් හා පාදෝනිත් ලෙස දක්වයි.
4) එක පෙළට ගමන් කරන සතුන් සතර දෙනාගෙන් සතර දිසාව සංකේතවත් කරයි.
5) පළාපෙති මෝස්තරයෙන් සත්ත්වයා රාග, දෝෂ, මෝහ ආදී කෙලෙස් ගින්නෙන් දැවෙන බවයි.

50. තෙරුවන් පිළිබඳ ශ්‍රද්ධාව ජනනය කිරීමත්, බුද්ධ චරිතය පිළිබිඹු කිරීමත්, ශාසන ඉතිහාසය ඉදිරිපත් කිරීමත් ආදිය අරමුණු කරගෙන මෙරට බෞද්ධ ගීත සාහිත්‍යය ගොඩනැඟී ඇති අතර පහත දැක්වෙන ගීත අතරින් වෙසක් පොහොය දින සිදුවූ තෙමඟුලින් බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වය පිළිබඳව පමණක් කියැවෙන ගීතය වන්නේ,

1) සුගත ලෝනා සම්බුද්ධ රාජා... යන ගීතය යි.
2) අමාදහර දිය ගලා ගලා යන... ගීතය යි.
3) අඩවන් වූ දෙනෙතින් ගලනා... යන ගීතය යි.
4) සන්නාලියනේ සන්නාලියනේ... යන ගීතය යි.
5) දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා... යන ගීතය යි.

***

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved }

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අ.පො.ස. උසස් පෙළ පෙරහුරු ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2026
க.பொ.த. உ/த முன்னோடி மாதிரி வினாப் பத்திரம் - 2026
G.C.E. A/L Pre-Model Model Question Paper - 2026

බෞද්ධ ශිෂ්ටාචාරය - II
பௌத்த நாகரீகம் - II
Buddhist Civilization - II

45 S II

කාලය : පැය 03 මිනිත්තු 10
நேரம் : 03 மணித்தியாலம் 10 நிமிடம்
Time : 03 Hours and 10 minutes

උපදෙස් :

- I **කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, II **කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමිවේ.

I කොටස

1.

i. වෛශ්‍ය ස්වධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)

ii. රාජාණ්ඩු පාලනයක පැවතිය යුතු මූලික ලක්ෂණ **තුනක්** ගෙනහැර දක්වන්න. (ලකුණු 03යි.)

iii. මක්ඛලී ගෝසාලගේ මූලික ඉගැන්වීම් විමර්ශනය කරන්න. (ලකුණු 04යි.)

iv. බුද්ධ කාලීන භාරතයේ දියුණු කෘෂි ආර්ථික රටාවක් පැවැති බව උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05යි.)

v. චතුර් වර්ණ සංකල්පය බුදු දහමින් ප්‍රතික්ෂේපවන ආකාරය සාධක **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

2.

i. 'අරහං' බුදු ගුණය අර්ථවත්වන කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02යි.)

ii. බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව ප්‍රකට වූ අවස්ථා **තුනක්** ගෙනහැර දක්වන්න. (ලකුණු 03යි.)

iii. සමකාලීනයන් විසින් බුදුරජාණන් වහන්සේ පිළිබඳව කළ ඇගයීම් නිදසුන් මගින් පෙන්වා දෙන්න. (ලකුණු 04යි.)

iv. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාව අර්ථ දක්වා එය බුදුසිරිතෙන් ඔපවත් වූ ආකාරය නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)

v. අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06යි.)

3.

i. ''යෝ චේ වස්සසතං ජීවේ...'' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)

ii. ඉහත 3.i හි සඳහන් ගාථාවේ අර්ථය නිවැරදිව ලියන්න. (ලකුණු 03යි.)

iii. සිගාලෝවාද සූත්‍රයට අනුව ස්වාමි-භාර්යා යුතුකම් සහ වගකීම් දහය නම් කරන්න. (ලකුණු 04යි.)

iv. පුද්ගල ක්‍රියාකාරීත්වය මත මෙලොව ජීවිතයේ පරිහානිය සිදුවන අයුරු පරාභව සූත්‍රාගත කරුණු **පහක්** ඇසුරින් පහදන්න. (ලකුණු 05යි.)

v. දස අකුසල්වලින් වැළකීම තුළ ලැබෙන සමාජයීය වටිනාකම අගය කරන්න. (ලකුණු 06යි.)

II කොටස

4.

i. මානව සමාජය මුහුණ දී ඇති පාරිසරික ගැටලු අවම කර ගැනීමට පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල ඇති වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 10යි.)

ii. හොඳ නරක තීරණය කිරීමට අදාළ බෞද්ධ නිර්ණායක සර්වකාලීන වටිනාකමකින් යුතු බව අගය කරන්න. (ලකුණු 10යි.)

5.

i. දෙවන ධර්ම සංගායනාවට බලපෑ පසුබිම සැකෙවින් දක්වා ශාසන ඉතිහාසය තුළ දෙවන ධර්ම සංගායනාවේ වැදගත්කම ප්‍රකට කරන්න. (ලකුණු 10යි.)

ii. බුදුසසුනෙහි සංරක්ෂණය සහ ව්‍යාප්තිය විෂයෙහි කණිෂ්ක රජතුමාගෙන් සිදුවූ දායකත්වය තක්සේරු කරන්න. (ලකුණු 10යි.)

6.

i. ප්‍රාග් මහින්ද යුගයේ ලක්දිව ක්‍රියාත්මකව පැවති ආගම් පිළිබඳ නිදසුන් සහිතව පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

ii. මහින්දාගමනයෙන් පසුව ලාංකීය රජවරුන්ගෙන් සිදු වූ ශාසනික සේවය දේවානම්පියතිස්ස සහ දුටුගැමුණු මහරජවරුන්ගේ සේවාවන් ඇසුරින් පහදන්න. (ලකුණු 10යි.)

7.

i. තායි සංස්කෘතිය බුදු දහමින් පෝෂණය වූ ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10යි.)

ii. ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා කලාවේ ආරම්භය සහ විකාශය විමර්ශනය කරන්න. (ලකුණු 10යි.)

8.

i. බෞද්ධ සංකල්ප ජනගත කිරීමට ජන කවියා දක්වන ලද නිපුණතාව නිදසුන් මගින් ප්‍රකට කරන්න. (ලකුණු 10යි.)

ii. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකකට** විවරණ සපයන්න.

1) වලහි විශ්වවිද්‍යාලය
2) වාහල්කඩ
3) දසරාජ ධර්ම
4) ආගන්තුක සත්කාරය (ලකුණු 05x2=10යි.)

***

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

අ.පො.ස.(උ.පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 2026

45 - බෞද්ධ ශිෂ්ටාචාරය

පිළිතුරු පත්‍රය

පළමු පත්‍රය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
1	4	11	3	21	4	31	2	41	5
2	1	12	2	22	1	32	2	42	4
3	4	13	1	23	2	33	5	43	2
4	3	14	5	24	2	34	5	44	5
5	1	15	1	25	3	35	4	45	4
6	5	16	3	26	1	36	3	46	4
7	4	17	5	27	5	37	2	47	5
8	2	18	3	28	3	38	3	48	2
9	2	19	1	29	4	39	3	49	1
10	3	20	3	30	5	40	1	50	1

II කොටස

1.

i. **වෛශ්‍ය ස්වධර්ම හතරක් නම් කරන්න.** **(ලකුණු 02යි.)**

පශූනං රක්ෂණං දාන - මීජ්‍යාධ්‍යයනමේවච
වණික්පථං කුසීදංච - වෛශ්‍යස්‍ය කෘෂිමේවච

- පශු පාලනය
- දන් දීම
- යාග කිරීම
- ඉගෙනීම
- වෙළඳාම් කිරීම
- මුදල් පොළියට දීම
- කෘෂි කර්මාන්තය

ii. **රාජාණ්ඩු පාලනයක පැවතිය යුතු මූලික ලක්ෂණ තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03යි.)**

- මහරජ කෙනකු විසින් පාලනය කිරීම.
- බොහෝ විට පිය පුතු පරපුරෙන් රජ පදවිය උරුම වීම.
- ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල රජුට හිමි වීම.
- රජතුමා නීති පැනවීම, නීති ක්‍රියාත්මක කරවීම හා දඬුවම් පැමිණවීම.
- යුවරජ, පුරෝහිත, අධිකරණ නායක, සේනාධිපති මඟින් බලය ක්‍රියාත්මක වීම.
- දුර්වල අසල්වැසි රාජ්‍යවල පාලකයන් පරදවා තම බලය පුළුල් කර ගැනීමට 'මත්ස්‍ය න්‍යාය' ක්‍රියාත්මක කිරීම. ඒ අනුව රාජ්‍යය, මහාරාජ්‍යය, මහා අධිරාජ්‍ය නිර්මාණය වීම.

iii. **මක්ඛලී ගෝසාලගේ මූලික ඉගැන්වීම් විමර්ශනය කරන්න.** **(ලකුණු 04යි.)**

- සත්ත්වයාගේ කෙළෙසීමට හෝ විශුද්ධියට හෝ හේතු ප්‍රත්‍යයයක් නැතැයි ඉගැන්වූ මොහු අහේතු අප්‍රත්‍යයවාදියකු විය.
- ඒ අනුව උත්සාහය, වීර්යය, අධිෂ්ඨානය, පුරුෂ බලය, පුරුෂ පරාක්‍රමය ප්‍රතික්ෂේප කරන මොහු සියලු සත්ත්වයන්, සියලු ප්‍රාණීන් විර්යය රහිත, බල රහිත, ස්ව කැමැත්තට අනුව කටයුතු කළ නොහැකි පිරිසක් ලෙස දක්වන බවත්, එනිසා ම මොහුගේ ඉගැන්වීම මඟින් කර්මය මෙන් ම සත්ත්වයාගේ කෙළෙසීමට හෝ විශුද්ධියට හෝ හේතු ප්‍රත්‍යයක් නැතැයි ඉගැන්වූ නිසා මොහු අහේතු අප්‍රත්‍යවාදියකු ලෙස සැලකේ.
- ස්වභාව නියතියකට අනුව සත්ත්වයාගේ සසර ගමන හා විමුක්තිය සිදු වේ යැයි පවසන මක්ඛලී ගෝසාල නියතිවාදියකු ලෙස ද අධිච්ච සමුප්පන්නවාදියකු ලෙස ද සැලකේ.
- මක්ඛලී ගෝසාලගේ ඉගැන්වීම් *නත්ථිකම්ම, නත්ථිකිරිය, නත්ථිවිරිය* යන පදවලින් හැඳින්වේ.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- මෙම ඉගැන්වීම් මඟින් කර්ම විපාක බැහැර කෙරෙන නිසා මක්ඛලී ගෝසාල ද අකිරියවාදියකු ද වේ.
- විවිධ වූ හුයෙන් වියන ලද වස්ත්‍ර අතර දුර්වර්ණ, දුර්ගන්ධ, දුක්ඛස්පර්ශ ඇති කේසකම්බිලියක් ඉතා පහත් තත්ත්වයේ ලා සැලකෙන්නාක් මෙන් විවිධ ශ්‍රමණවාද අතර මක්ඛලීවාදය පහත් ම වාදය ලෙස බුදුරජාණන් වහන්සේ විසින් ම පෙන්වා දී ඇත.
- ගංගා මුවෙහි ගිල්වා තබන ලද කෙමණ බොහෝ මත්ස්‍යයන්ගේ විනාශය පිණිස හේතු වන්නා සේ මක්ඛලී වනාහි බොහෝ මිනිසුන්ට අහිත, අවැඩ, ව්‍යසනය පිණිස ලෝකයෙහි උපන් මිනිස් කෙමණක් ලෙස හඳුන්වා ඇත.
- ***නත්ථි මහාරාජ හේතු, නත්ථි පච්චයෝ සත්තානං සංකිලේසාය, අහේතු අප්පච්චයා සත්තා සංකිලිස්සන්ති, නත්ථි හේතු නත්ථි පච්චයෝ සත්තානං විසුද්ධියා, අහේතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති, නත්ථි අත්තකාරේ, නත්ථි පරකාරෙ, නත්ථි පුරිසකාරෙ, නත්ථිබලං, නත්ථි විරියං, නත්ථි පුරිස ථාමෝ, නත්ථි පුරිස පරක්කමෝ සබ්බේ සත්තා, සබ්බේ පාණා සබ්බේ භූතා, සබ්බේ ජීවා, අවසා, අබලා, අවිරියා නියතිසංගතභාවපරිණතා ඡස්සේවාභිජාතීසු, සුඛදුක්ඛං, පටිසංවේදෙන්ති.... සෙය්‍යථාපි නාම සුත්ත ගුළෙ ඛිත්තේ නිබ්බෙඨියමානමේව පලේති, ඒවමේව බාලේච, පණ්ඩිතේච, සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්තීති.***

iv. **බුද්ධ කාලීන භාරතයේ දියුණු කෘෂි ආර්ථික රටාවක් පැවැති බව උදාහරණ ඇසුරින් විස්තර කරන්න.** **(ලකුණු 05යි.)**

- ආර්ය ජනාවාස ආරම්භයට පෙර සිට ම කෘෂිකර්මාන්තය ප්‍රබල ජීවන වෘත්තියක් ව පැවතී ඇත.
- බෞද්ධ සාහිත්‍යාගත මූලාශ්‍රය අනුව 'බත' භාරතීය ජනයාගේ ප්‍රධාන ආහාරය විය.
- 'බත' ඕදන නාමයෙන් හඳුන්වා ඇත.
- පුද්ගල නාමවලට පවා ඕදන යන්න ඇතුළත් වීම. උදා : සුද්ධෝදන, අමිතෝදන, දෝතෝදන, මිතෝදන
- කසීභාරද්වාජ සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය ඇතුළු බොහෝ සූත්‍රවල කෘෂිකාර්මික කටයුතු පිළිබඳ සඳහන් වීම.
- කූටදන්ත සූත්‍රයෙහි සඳහන් වන ආකාරයට කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන්ට රාජානුග්‍රහය ලබාදිය යුතු බව දක්වා ඇත.
- වප්මඟුල් උත්සවය රජු සහභාගි වන වැදගත් උත්සවයක් ලෙස පැවතී ඇත.
- අග්ගඤ්ඤ සූත්‍රයේ කෙත්වතුවලට අධිපති වූ රජ කුලය ***'ඛෙත්තානං අධිපතීති ඛෝ වාසෙට්ඨ ඛත්තියෝ'*** නමින් හඳුන්වා කෘෂිකර්මය ක්ෂත්‍රියයන්ගේ කාර්යයක් බව දක්වා ඇත.
- කසීභාරද්වාජ වැනි බමුණන් පවා කෘෂිකර්මාන්තයේ යෙදී තිබීම.
- විශාල කෙත්වතු, ධාන්‍ය ගබඩා හිමිකරුවන් සිටුවරයින් වී සිටීම.
- මගධ කෙත්යායේ ආකෘතියට අනුව බෞද්ධ භික්ෂූන්ගේ සිවුරු සකසා තිබීම.
- බුද්ධ කාලීන භාරතයේ දියුණු වාරිමාර්ග පද්ධති පැවතී තිබීම හා ජලය පිළිබඳ වූ ගැටලුවල දී බුදුරජාණන් වහන්සේ මැදිහත් වී තිබීම.

උදා : රෝහිණී නදියේ ජලය උදෙසා වූ ශාක්‍ය කෝලිය ගැටුම සංසිඳවීම.

- බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කිරීමේ දී කෘෂි කර්මාන්තය හා තදානුබද්ධ අංග උපමා වශයෙන් යොදාගෙන තිබීම.

  උදා : *සද්ධා බීජං තපෝ වුට්ඨී - පඤ්ඤූ මේ යුග නංගලං*

  හිරි ඊසා මනෝ යොත්තං පඤ්ඤූ මේ යුග නංගලං (සං.නි. - කසී භාරද්වාජ සූත්‍රය)

- කෘෂි කර්මාන්තය දැහැමි වෘත්තියක් ලෙස ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් වී තිබීම.

v. **චතුර් වර්ණ සංකල්පය බුදු දහමින් ප්‍රතික්ෂේප වන ආකාරය සාධක තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.** **(ලකුණු 06යි.)**

- ප්‍රධාන සාධක කිහිපයක් ඔස්සේ චතුර් වර්ණ සංකල්පය බුදු දහමින් ප්‍රතික්ෂේප වී ඇත.
- ඓතිහාසික සාධක
- ජීව විද්‍යාත්මක සාධක
- සමාජ විද්‍යාත්මක සාධක
- ආචාර විද්‍යාත්මක සාධක

- **ඓතිහාසික සාධක**
  - *ඛත්තියෝ සෙට්ඨෝ ජනෙතස්මිං - යෙ ගොත්ත පටිසාරිනෝ*
    විජ්ජාචරණ සම්පන්නං - සෝ සෙට්ඨෝ දේව මනුස්සේති (දී.නි., අම්බට්ඨ සූත්‍රය)
    ගෝත්‍රය පිළිබඳ විමසීමේ දී ක්ෂත්‍රිය කුලය ශ්‍රේෂ්ඨ වේ. දෙවි මිනිසුන් අතර විජ්ජාචරණ සම්පන්නවූ බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ වේ.
  - අම්බට්ඨ බ්‍රාහ්මණයාගේ සත්මුතු පරම්පරාවේ සත්වැන්නා වූ කණ්හායන නමැත්තා ක්ෂත්‍රිය වංශිකයෙකුගේ නිවසේ බැල මෙහෙවරකම් කළ දිසා නමැති ශූද්‍ර කාන්තාවක විසින් බිහි කළ බවත් ඉතිහාසයේ කිසිදු කුලයක් අමිශ්‍රව නොපවත්නා බවත් දක්වා තිබීම.
  - වර්ණ පාරිශුද්ධිය පිළිබඳ සැක සංකා තිබුණු බැවින් බමුණන් පාරිශුද්ධිය සෙවීම පරම්පරා හතකට සීමා කිරීම. 'සත්මුතු පරම්පරාවෙන් පාරිශුද්ධ'
  - අග්ගඤ්ඤ සූත්‍රයට අනුව,
    'ඛෙත්තානං අධිපතීති ඛෝ වාසෙට්ඨ ඛත්තියෝ' කෙත්වතුවලට අධිපති බැවින් ක්ෂත්‍රිය,
    'පාපකේ අකුසලේ ධම්මේ බාහෙන්තීති ඛෝ වාසෙට්ඨ බ්‍රාහ්මණා' පාප අකුසල බැහැර කරන අය බ්‍රාහ්මණ,
    'මේථුනං ධම්මං සමාදාය විසුකම්මන්තේ පයොජෙන්තීති ඛෝ වාසෙට්ඨ වෙස්සා' මෙවුන්දම් සේවනය පශුපාලනාදී කෘෂිකර්මාන්තයේ නියැලුණ අය වෛශ්‍ය,
    'ඛුද්ද ලුද්ද සමාචාරා ඛෝ වාසෙට්ඨ ශූද්දා' රළු පරළු නොදියුණු පහත් හැසිරීම් ඇති අය ශූද්‍ර ලෙස ඓතිහාසික සාධක දක්වා ඇත.

- **ජීව විද්‍යාත්මක සාධක**
  - *යථා ඒතාසු ජාතීසූ ලිංගං ජාතිමයං පුථූ*
    ඒවං නත්ථි මනුස්සේසූ ලිංගං ජාති මයං පුථූ

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

මනුෂ්‍ය වර්ගයාගේ ජාතිමය වශයෙන් වෙනසක් නැත. ඇත්තේ ස්ත්‍රී පුරුෂ යැයි ලිංග භේදයක් පමණි.

- *දිස්සන්ති ඛෝ පන අස්සලායන බ්‍රාහ්මණානං බ්‍රාහ්මණියෝ උතුනියෝපි, ගබ්භනියෝපි, විජායමානාපි, පායමානාපි තෙ ච බ්‍රාහ්මණා යොනිජාය සමානා ඒවමාහංසු බ්‍රාහ්මණාව සෙට්ඨෝ වණ්ණෝ හීනෝ අඤ්ඤේ වණ්ණෝ*
  බමුණන්ගේ බැමිණියන් ගර්භණී වීම, දරුවන් බිහි කිරීම, කිරි පෙවීම, ඇස් ඉදිරියේ පෙනෙන්නට ඇත. ස්ත්‍රී යෝනියෙන් බ්‍රාහ්මණයන් ද උපදින බව ඔවුහු දකිති. එසේ තිබියදීත් මහා බ්‍රහ්මයා උපත දුන් බව පැවසීම මුලාවකි.

- **සමාජ විද්‍යාත්මක සාධක**
  - අද ආර්ය ජාතියේ ඇති අය හෙට දාසයන් විය හැකිය. අද දාසයන් හෙට ආර්යයන් විය හැකිය.
    අය්‍යෝ හුත්වා දාසෝ හෝති, දාසෝ හුත්වා අය්‍යෝ හෝති
  - සටන් බිමේ දී රජු තම රථාචාර්යයාට සම්මත රථකාර ලෙස සමාන මට්ටමකින් කතා කිරීම.
  - ආර්ථිකයෙන් උසස් නම් පහළ කුලයක අයෙකුට වුව ද උසස් කුලයක අය සේවයට බඳවා ගත හැකිවීම.
  - ධනය බලය හමුවේ ජාතිය කුලය එතරම් වැදගත් සාධක නොවන බව පෙන්වා දී තිබීම.

- **ආචාර විද්‍යාත්මක සාධක**
  - පුද්ගලයාගේ උසස් පහත් බව තීරණය වන්නේ ජාතිය මත නොව ක්‍රියාකලාපය මත බව වසල සූත්‍රයේ දක්වා තිබීම.
  - *නජජ්ජා වසලෝ හෝති න ජච්චා හෝති බ්‍රාහ්මණෝ*
    කම්මනා වසලෝ හෝති න කම්මනා හෝති බ්‍රාහ්මණෝ

2.

i. **'අරහං' බුදු ගුණය කෙටියෙන් විස්තර කරන්න.** **(ලකුණු 02යි.)**

- සියලු කෙලෙස්වලින් දුරු වූ බැවින් ද, සංසාර චක්‍රයේ අර සිඳලූ බැවින් ද, කෙලෙස් සතුරන් නැසූ බැවින් ද, රහස් නොමැති බැවින් ද, (*න රහං යස්ස සො අරහං*) එනම් රහසින් හෝ පව් නො කරන බැවින් ද, සියලු පූජාවන්ට සුදුසු වූ හෙයින් ද, බුදුරජාණන් වහන්සේ 'අරහං' යනුවෙන් හඳුන්වනු ලැබේ.

- රහසත් පව් නොකොට
  කෙලෙසරයනුත් දුරු කොට
  නිසි වූයෙන් පුදට
  අරහ යයි නම කියති මුනිඳුට (බුදුගුණ අලංකාරය)

ii. **බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව ප්‍රකට වූ අවස්ථා තුනක් ගෙනහැර දක්වන්න. (ලකුණු 03යි.)**

- බුදුරජාණන් වහන්සේගේ සතුව පැවති කරුණාව මහා කරුණාව වන්නා සේ ම ප්‍රඥාව මහා ප්‍රඥාව වන්නේ ය.
- විදර්ශනා ඥානය හෙවත් ලෝකයේ ඇත්ත ඇති සැටියෙන් දක්නා නුවණ ප්‍රඥාව වන අතර එය ලෝකය හා ජීවිතය පිළිබඳව බුදුරජාණන් වහන්සේ සතුව පැවති ගැඹුරු නුවණයි.
- අනුපූර්ව ශික්ෂාවේ තෙවන පියවර ප්‍රඥාව යි.
- බුදුරජාණන් වහන්සේගේ සතුව පැවති මහා ප්‍රඥාවට විෂය නොවුණු කිසිවක් සක්වලෙහි ම නැත.
- බුදුරජාණන් වහන්සේගේ සතුව පැවති විවිධ ඥාන දර්ශනයන්ගෙන් ප්‍රඥා මහිමය ප්‍රකට වේ.
- *ත්‍රිවිද්‍යා ඥානය, අෂ්ට විද්‍යා ඥානය, සර්වඥතා ඥානය, දසබල ඥානය* ආදි වශයෙන් එය විවිධාකාර ය.
- බුද්ධ ශරීරය කොතරම් දුර්වල වුව ද උන් වහන්සේගේ ප්‍රඥා ශක්තියෙහි කිසි දු වෙනසක් නොවේ යයි මජ්ඣිම නිකායේ මහා සීහනාද සූත්‍රයෙන් දක්වා ඇත.
- චුල්ලහත්ථිපදෝම සූත්‍රයේ දී පිලෝතික පරිබ්‍රාජක බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥාව විශේෂයෙන් අගය කර ඇත.
- බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව ආදර්ශයට ගෙන පුද්ගලයෙකුගේ මෙලොව ජීවිතය මෙන් ම පරලොව ජීවිතය ද අර්ථවත් එකක් බවට පත් කර ගැනීමටත් සසර දුකින් අත් මිදීමටත් හැකියාව ලැබේ.
- බුදුරජාණන් වහන්සේගේ සෙසු ගුණාංගවලට වඩා මහා ප්‍රඥාව ශ්‍රේෂ්ඨ යැයි උන්වහන්සේ ම දේශනා කර ඇත. (මහා සකුළුදායි සූත්‍රය)

iii. **සමකාලීනයන් විසින් බුදුරජාණන් වහන්සේ පිළිබඳව කළ ඇගයීම් නිදසුන් මගින් පෙන්වා දෙන්න.** **(ලකුණු 04යි.)**

- බුදුරදුන් පිළිබඳ ව තත්කාලීන ව ඇගයීම් සිදු කළ බෞද්ධ - අබෞද්ධ බොහෝ පිරිස් අතුරෙන් කිහිප දෙනෙකුගේ ඇගයීම් විමසා බැලීමෙන් ඒ බව පැහැදිලි වේ.
- කොණ්ඩඤ්ඤ, සාරිපුත්ත, රට්ඨපාල ආදි මහ තෙරවරුන් විසින් බුදුරදුන් ඇගයීමට ලක් කරනු ලැබ ඇත.
- බුදුරදුන්ගේ මුල් ම පැවිදි පිරිසට ඇතුළත් වූ කොණ්ඩඤ්ඤ මහ රහතන් වහන්සේ තමන්ගේ භව ගමන නවතාලීමට බුදුරදුන්ගේ අනුශාසනා ඉවහල් වූ බව දක්වා ඇත්තේ මෙසේ ය:

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- *''මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරන ලදී. බුදුරදුන් විසින් අනුශාසනය කරන ලද්දේ ය. ගුරු වූ බර බහා තබන ලදි. තණ්හා නම් වූ භවයෙහි නියාමකත්වය විනාශ කරන ලදී. යම් අර්ථයක් සඳහා ගිහිගෙයින් නික්ම පැවිද්දට පැමිණියේ වී නම් ඒ අර්ථය මා විසින් කරන ලද්දේ ය. මට සහවාසියකුගෙන් කවර ප්‍රයෝජන ද?''*
- බුදුරදුන්ගේ අග්‍ර ශ්‍රාවක සැරියුත් තෙරුන් වහන්සේ ද මේ අයුරින් ඇගැයීම් කර ඇත. ඉන් එක් අවස්ථාවක් මෙසේ දැක්විය හැකි ය.
- *''සම්බෝධිය ගැන සැලකීමේ දී බුදුරජාණන් වහන්සේට වඩා විශිෂ්ට ඥාන ලබාගත් අන්‍ය ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු හෝ ඇති වූයේත් නැත. දැනට ඇත්තේත් නැතැයි.''* ප්‍රකාශ කරති.
- චංකී, සෝණදණ්ඩ, අස්සලායන ආදි බ්‍රාහ්මණ පඬිවරුන් ද, වච්ඡගොත්ත, පොට්ඨපාද, චූලසකුලුදායි, උපාලි ආදි වෙනත් ආගමිකයන් ද බුදුරජාණන් වහන්සේ ඇගයීමට ලක් කළ අවස්ථා සූත්‍ර ධර්මවල සඳහන් වේ.
- කෝසල, බිම්බිසාර, අජාසත්ත වැනි මහ රජවරුන් ද සුදත්ත සිටු, අභයරාජ කුමරු වැනි පිරිස් ද විසින් බුදුරදුන් පැසසුමට ලක් කර ඇත.
- බුදුරදුන් මනුෂ්‍යයන්ගේ පමණක් නොව දෙවිවරුන්ගේ ද වර්ණනාවට ලක් වූ අයුරු මහා ගෝවින්ද සූත්‍රය ආදි සූත්‍රවලින් පැහැදිලිවේ.
- බුදුරජාණන් වහන්සේ පිළිබඳ විවිධ පුද්ගලයන් විසින් කළ වර්ණනා කිහිපයක් පහත දැක්වේ.
- *''භවත්නි, මහණ ගොයුම්තුමා වූ කලි මවුපසින් ද පියපසින් ද යන දෙපසින් ම අභිජාත ය. සත්වන මීමුතු පරපුර තෙක් පිරිසිදු මවුකුස ඇත්තෝ ය. ජාතිවාදයෙන් නො හෙලන ලද්දෝ ය.''* (දී.නි. සෝණදණ්ඩ සූත්‍රය)
- *''භාග්‍යවත් ගෞතමයන් වහන්ස, ඔබ දෙසූ ධර්මය ආශ්චර්ය ය. යටිකුරු කොට තැබූ භාජනයක් උඩුකුරු කොට තබන්නාක් මෙන් යටපත් වූ දෙයක් මතු කරන්නාක් මෙන් මංමුලා වූ කෙනෙකුට මග කියා දෙන්නාක් මෙන් ඇස් ඇත්තෝ රූප දකිත්වා යි අන්ධකාරයේ සිටින කෙනෙකුට පහන් එළියක් දල්වන්නාක් මෙනි. අනේකාකාරයෙන් ගෞතමයන් වහන්සේ දහම් දෙසූහ.''* (සු.නි. කසීභාරද්වාජ සූත්‍රය)
- *''භගවත් ගෞතමයන් වහන්සේ කුලවත්, ධනවත්, වෘද්ධ, කාම ආශා දුරු කළ අයෙකි. විශාල පිරිසකට ආචාර්යවරයෙකි. කොසොල් රජුගේ පවා ගරු බුහුමනට ලක් වූ උන්වහන්සේ සරණ ගිය දෙව් බඹුහු බොහෝ වෙති.''* (චංකි සූත්‍රය)
- *''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙහි වඩින සේක්වා. භාග්‍යවතුන් වහන්සේගේ වැඩීම යහපති, භාග්‍යවතුන් වහන්සේ බොහෝ කලකින් මෙහි වැඩීම කළහ. භාග්‍යවතුන් වහන්සේ වැඩ හිඳින සේක්වා.''* (මහා සකුළුදායි සූත්‍රය)

iv. **බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාව අර්ථ දක්වා එය බුදුසිරිතෙන් ඔපවත් වූ ආකාරය නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.** **(ලකුණු 05යි.)**

- අනුන්ගේ දුක දැක ගුණ භරිත හදවතක් ඇති අයකු තුළ ඇති වන දයානුකම්පාව කරුණාව යි.
- ***"පරදුක්ඛේ සති සාධූනං හදය කම්පනං කරෝතීති කරුණා"*** - අනුන්ගේ දුකෙහි දී සත්පුරුෂයන්ගේ හදවතෙහි ඇති කරන කම්පනය කරුණාව යි.

- *"අහිත දුක්ඛාපනයන කාමනා කරුණා"* - අන්‍යයන්ගේ දුක් කරදර නැති කිරීමේ කැමැත්ත කරුණාව යි.
- *"කිණාතිවා පරදුක්ඛං හිංසනි විනාසේතීනි කරුණා"* - අන්‍යයන්ගේ දුක් විනාශ කිරීම කරුණාව යි.
- සතර බ්‍රහ්ම විහරණයන්ගේ දෙවැන්න කරුණාව ය.
- සසර දුකට පත් ව සිටින සත්ත්වයා දැක බුදුවරයකු තුළ ඇතිවන අනුකම්පාව මහා කරුණාව නම් වේ.
- බුදුවරයකුට හැර වෙනත් කිසිවකුට නොපිහිටන උතුම් ගුණ සමුදායයන් අතුරින් එකක් ලෙස මහා කරුණාව සැලකෙන බව හා එය බුද්ධ සමාපත්තියක් මෙන් ම බුද්ධ ඥානයක් ද වේ.
- බුදුරජාණන් වහන්සේ වනාහි මහා කරුණාවේ හා මහා ප්‍රඥාවේ ප්‍රතිමූර්තියක් බව.
- බුදුරජාණන් වහන්සේ දින චර්යාව ආරම්භ කරන්නේ මහා කරුණා සමාපත්තියට සමවැදී බුද්ධඥානයෙන් ලොව බැලීමෙනි.
- මුළු මහත් බුද්ධ චරිතය පුරාවට ම මෙම ගුණය පිළිබිඹු වේ.
- සුනීත, සෝපාක, රජ්ජුමාලා, කිසාගෝතමී, මට්ටකුණ්ඩලී, පූතිගත්තතිස්ස තෙරුන්, හත්ථාලවක කුමරු, කෙත පාළු වූ ගොවියා, භද්‍රවතිකා ඇතින්න ආදීන්ගේ කතා පුවත් මඟින් මහා කරුණා ගුණය පිළිබිඹු වේ.

v. **අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ඇගයීමට ලක් කරන්න.** **(ලකුණු 06යි.)**

- සුදත්ත සිටුතුමා නම් වූ මෙතුමා පසු ව අනාථපිණ්ඩික සිටුතුමා නමින් ප්‍රකට විය.
- සැවැත් නුවර සුමන සිටුතුමා අනාථපිණ්ඩික සිටුතුමාගේ පියා ය.
- රජගහ නුවර සිටුවරයාගේ නැඟණිය සමඟ විවාහ වීම නිසාත් ව්‍යාපාරික කටයුතු සඳහාත් නිතර රජගහ නුවරට ගිය බව හා එහි දී බුදුරජාණන් වහන්සේගේ හමුව සිදු විය.
- මෙතුමා බුදුරජාණන් වහන්සේ නිතර ඇසුරු කිරීම නිසා සැදැහැවත් බෞද්ධයකු විය.
- බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේලාට 54 කෝටියක් ධනය වියදම් කර ජේතවනාරාම විහාරය සකස් කොට පූජා කළේ ය.
- දන් දීමේ ඇලුණු උවසුන් අතර අග තනතුර ලබා සිටියේ ය.
- මෙතුමාගේ චරිතය තුළ තිබූ ගුණ අතර අනතිමානීකම, නිර්ලෝභිත්වය, ශාසන ළැදියාව, ඥති හිත මිත්‍රාදීන් ආගම දහමට යොමු කිරීමට උත්සාහ කිරීම, ආදිය ආදර්ශයට ගත හැකි ය.

3.

i. ''යෝ චේ වස්සසතං ජීවේ...'' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න. **(ලකුණු 02යි.)**

යෝ චේ වස්සසතං ජීවේ
කුසීතෝ හීන වීරියෝ
ඒකාහං ජීවිතං සෙය්‍යෝ
විරිය මාරභතෝ දළ්හං

ii. ඉහත 3.i හි සඳහන් ගාථාවේ අර්ථය නිවැරදිව ලියන්න. (ලකුණු 03යි.)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

කම්මැළි වූ කායික චෛතසික වීර්ය නැති කෙනෙකුගේ සියක් අවුරුදු ජීවිතයට වඩා දැඩි වීර්යයෙන් යුක්තයාගේ එක දවසක ජීවත්වීම ඉතා උතුම් ය.

iii. **සිගාලෝවාද සූත්‍රයට අනුව ස්වාමි-භාර්යා යුතුකම් සහ වගකීම් දහය නම් කරන්න. (ලකුණු 04යි.)**

සැමියාගේ යුතුකම්

(1) බිරිඳ සතුටු වන පරිද්දෙන් ප්‍රිය වචනයෙන් කථා කිරීම.

(2) බිරිඳට අවමන් නො කිරීම.

(3) සිය බිරිඳ හැර අන් ස්ත්‍රීන් සේවනය නො කිරීම.

(4) ආභාර පිළියෙල කිරීම් ආදි ගෙයි කටයුතුවලට අධිපති බව පැවරීම.

(5) වස්ත්‍රාභරණ පිළියෙල කරදීම.

භාර්යාවගේ යුතුකම්

(1) කලට වේලාවට ආහාර පිළියෙළ කිරීම් ආදි ගෙයි කටයුතු මනා කොට කිරීම.

(2) තමාගේ සැමියාගේ නෑ මිතුරන්ට මනා කොට සංග්‍රහ කිරීම.

(3) සිය සැමියා හැර අන් පුරුෂයන් නො පැතීම.

(4) හිමියා සපයන ධනය ආරක්ෂා කිරීම.

(5) සියලු කටයුතු අනලසව කිරීම.

iv. **පුද්ගල ක්‍රියාකාරීත්වය මත මෙලොව ජීවිතයේ පරිහානිය සිදුවන අයුරු පරාභව සූත්‍රාගත කරුණු පහක් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 05යි.)**

- ධර්මයට කැමති තැනැත්තා දියුණු වන්නේ ය. ධර්මයට ද්වේශ කරන්නා පිරිහෙන්නේ ය.
- අසත්පුරුෂයන් කෙරෙහි ප්‍රිය වෙයි. සත්පුරුෂයා කෙරෙහි ප්‍රිය නොකෙරෙයි. අසත්පුරුෂ ධර්මය ප්‍රිය කරයි. එය පුද්ගලයාගේ පිරිහීමට හේතු වේ.
- නිතර නිදන සුලු වේ ද, පිරිස සමඟ එකට සිටීමට කැමති වේ ද, උට්ඨාන වීර්යයෙන් තොර වූයේ වේ ද, අලස වූයේ වේ ද, නිතර කිපෙන සුලු වේ වේ ද එය පුද්ගලයාගේ පිරිහීමට හේතු වේ.
- තමාට හැකියාව තිබිය දී මහලු ව ජරාවට ගිය මව හෝ පියා හෝ පෝෂණය නොකරයි ද, එය පිරිහීමට හේතුවකි.
- තමන් වෙත පැමිණෙන ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු හෝ වෙනත් යාචකයකු හෝ බොරුවෙන් රවටා ද, එය පිරිහීමට හේතුවකි.
- බොහෝ රන් රිදී මුතු මැණික් හා කහවණු ඇති, ආහාරපාන හොඳින් ඇති පුද්ගලයෙක් තනි ව ම ඒවා පරිභෝග කෙරේ ද, එය පිරිහීමට හේතුවකි.
- ජාතිය නිසා හෝ ධනය නිසා හෝ ගෝත්‍රය නිසා හෝ ඇතිවූ මානයෙන් යුක්ත යම් මිනිසෙක් සිය ඥාතීන් පහත් කොට සලකා ද, එය පිරිහීමට හේතුවකි.
- මිනිසෙක් ස්ත්‍රීන් කෙරෙහි ලොල් වූයේ, සුරාවෙහි ලොල් වූයේ, සූදුවෙහි ලොල් වූයේ තමාට ලැබෙන ලැබෙන දේ විනාශ කරයි ද, එය පිරිහීමට හේතුවකි.
- තම බිරියගෙන් සතුටට පත් නොවූයේ වෙසඟනන් වෙත යයි ද, පරඅඹුවන් වෙත යයි ද, එය පිරිහීමට හේතුවකි.

- තරුණ විය ඉක්මවූ පුද්ගලයකු තිඹිරිගෙඩි වැනි පියවුරු ඇති තැනැත්තියක ආවාහ කොට ගෙන ඒ ද, ඇය කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් නොනිඳා සිටී ද එය පිරිහීමට හේතුවකි.
- සුරාව, සූදුව, මස් මාංස ආදියෙහි ලොල් වූ ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ පරිපාලනයෙහි යොදවයි නම් එය පිරිහීමට හේතුවකි.
- අල්ප වූ භෝග සම්පත් ඇති ව මහා තෘෂ්ණාවෙන් යුක්ත ව ක්ෂත්‍රිය කුලයෙහි උපන්නෙක් රජකම ප්‍රාර්ථනා කරයි ද, එය පිරිහීමට හේතුවකි.

v. **දස අකුසල්වලින් වැළකීම තුළ ලැබෙන සමාජයීය වටිනාකම ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06යි.)**

- ලෝභ, දෝෂ, මෝහ චේතනා පූර්වාංගම ක්‍රියා අකුසල් යනුවෙන් හැඳින්වේ.
- එවැනි අකුසල් දහයක් බෞද්ධ ධර්මයෙහි සුවිශේෂ කොට දක්වා ඇත. ඒවා දස අකුසල් නාමයෙන් හැඳින්වේ.
- පාණඝාත පරද්ධබ්බං - පරදාරංච කායතෝ
  මුසාපේසුඤ්ඤ ඵරුසා - සම්ඵප්පලාපා වාචතෝ
  අභිජ්ඣාචේව ව්‍යාපාදෝ - මිච්ඡා දිට්ඨිච මානසෝ
  1. ප්‍රාණඝාතය
  2. අදත්තාදානය
  3. පරදාර සේවනය
  4. මුසාවාදය
  5. පෙසුඤ්ඤ හෙවත් කේළාම් කීම
  6. පරුෂ වචනය
  7. හිස් වචනය
  8. අභිධ්‍යාව හෙවත් දැඩි ලෝභය
  9. ව්‍යාපාදය හෙවත් තරහව
  10. මිථ්‍යාදෘෂ්ටිය
- මෙම දස අකුසල්, කායික ව, වාචසික ව මෙන් ම මානසික ව ද සිදු වේ.
- දස අකුසලයෙන් වෙන් ව කටයුතු කිරීම දස කුසලය ලෙස හැඳින්වේ.
- මේ දස අකුසලයෙන් වැළකීමෙන් සැලසෙන සමාජයීය වටිනාකම අගයමින් පිළිතුර ගොඩනගා තිබිය යුතුය.

II කොටස

4.

i. **මානව සමාජය මුහුණ දී ඇති පාරිසරික ගැටලු අවම කර ගැනීමට පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල ඇති වැදගත්කම පරීක්ෂා කරන්න.** (ලකුණු 10යි.)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- අවිධිමත් සංවර්ධනය සහ වෙනත් විවිධ සාධක පදනම් කොට ගනිමින් ජල දූෂණය, වායු දූෂණය, ශබ්ද දූෂණය, වන විනාශය, කැලි කසළ ගොඩ ගැසීම ආදී පාරිසරික ගැටලු රැසක් වර්තමානයේ උද්ගතව ඇත.
- වර්තමානයේ පරිසර විනාශය හේතු කොටගෙන කායික හා මානසික ගැටලු රාශියක් උද්ගතව ඇති අතර, මාරාන්තික රෝගවලට ගොදුරු වීමේ ප්‍රවණතාව ද, දිනෙන් දින වැඩි වෙමින් පවතී.
- එසේ ම විශ්වයේ අසමතුලිත භාවය නිසා ඕසෝන් ස්ථරයට හානි වීම වැනි විශ්වීය ගැටලු ද උද්ගතව ඇත.
- ගෝලීය උෂ්ණත්වය වැඩිවීම බරපතල ගැටලුවකි.
- මේ නිසා මනුෂ්‍ය වර්ගයාගේ මෙන් ම සමස්ත ජීව පරිසරයේ ම අනාගත පැවැත්ම අභියෝගයට ලක්ව ඇත.
- වර්තමානය වන විට උද්ගතව ඇති යථෝක්ත පාරිසරික ගැටලු අවම කර ගැනීමෙහි ලා පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් උපයෝගි කොට ගත හැකි ය.
- පරිසර සංරක්ෂණය සඳහා පුද්ගලයන් යොමුකරවීම පිණිස බුදුරදුන් ගත් ක්‍රියා මාර්ග
    - බුදු සමය පරිසරය පිළිබඳව දක්වන සුහදශීලී ආකල්පය
    - බුද්ධ චරිතය හා පරිසරය අතර ඇති සබඳතාව
- ඇගයීම්
    - ***රමණීයානි අරඤ්ඤානි*** - ධම්මපදය
    - නේරඤ්ජන නදී තීර වර්ණනය - අරිය පරියේසන සූත්‍රය
- පැනවීම්
    - කොළ කැඩීම, ගස් කැපීම භික්ෂූන්ට ආපත්තියක් බව දැක්වීම - පාචිත්තියපාළිය
    - බීජගාම, භූතගාම ශික්ෂා පදය මගින් පඤ්චවිධ බීජ විනාශය ආපත්තියක් බව දැක්වීම - පාචිත්තිය පාළිය
    - කැලි කසළ බැහැර කිරීම පිළිබඳ ඉගැන්වීම
    - නොගිලන් තැනැත්තා ජලයට මුත්‍රා කිරීම, මලපහ කිරීම, කෙළ ගැසීම නොකළ යුතු යැයි සේඛියාවල දැක්වේ. ***(න උදකෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා)***
    - නොගිලන් තැනැත්තා නිල් තණමත මුත්‍රා කිරීම, මලපහ කිරීම, කෙළ ගැසීම නොකළ යුතුය. ***(න හරිතෙ අගිලානො උච්චාරං වා...)*** - විනය ශික්ෂා
    - උඩුසුළඟට ගසාගෙන යන ලෙස පාපිසි ආදිය ගසා නොදැමිය යුතුය (වත්තක්ඛන්ධකය)
- දේශනා
    - ***ආරාමරෝපා වනරෝපා...*** - වනරෝප සූත්‍රය
    - ***වනං ඡින්දථ මා රුක්ඛං...*** - ධම්ම පදය
    - සිංසපා සූත්‍රය, කසීභාරද්වාජ සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය

ii. **හොඳ නරක තීරණය කිරීමට අදාළ බෞද්ධ නිර්ණායක සර්වකාලීන වටිනාකමකින් යුතු බව අගය කරන්න.** **(ලකුණු 10යි.)**

- කළ යුතු නො කළ යුතු දෑ තීරණය කර ගැනීමට භාවිත කරන මිනුම් දඬු, නිර්ණායක ලෙසින් හඳුන්වනු ලැබේ.
- වපුරන බීජ අනුව ම අස්වැන්න ලැබෙන අයුරින් පුද්ගලයා විසින් කරනු ලබන හොඳ නරක ක්‍රියා අනුව ප්‍රතිඵල ලැබෙන බව.
- *'යාදිසං වපතේ බීජං තාදිසං හරතේ ඵලං කල්‍යාණකාරී කල්‍යාණං පාපකාරී ච පාපකං'*
- මිනිසා විසින් සචේතනිකව සිදු කරනු ලබන ක්‍රියාකාරකම් ඇගයුම් කරණයට ලක් කොට ඇත. ඒ බව,
- *කුසල - අකුසල, පුඤ්ඤ - පාප, සාධු - අසාධු, සාවජ්ජ - අනවජ්ජ, කරණීය - අකරණීය, සම්මා - මිච්ඡා, අරිය - අනරිය, විඤ්ඤුගරහිත - විඤ්ඤුපසත්ථ* ආදී හොඳ නරක දෙපක්ෂයට ම අයත් යුගල පදවලින් පැහැදිලි වේ. මෙම ඇගයුම්කරණය සිදු කොට ඇත්තේ කිසියම් නිර්ණායකයක් පදනම් කර ගෙන ය.
- එසේ නිර්ණායක ලෙස උපයෝගී කොට ගත හැකි ධර්මෝපදේශ කහිපයක් නිකායාගත සූත්‍රවලින් සොයාගත හැකි ය.
- කාලාම සූත්‍රයෙහි *'මා අනුස්සවේන...'* ආදී වශයෙන් තත්කාලීන ව පැවති නිර්ණායක ප්‍රාමාණික වශයෙන් නො සැලකිය යුතු බව දැක් වේ.
- පුද්ගලයා ලෝභ, දෝස, මෝහ සහගත වූ කල්හි සියලු අකුසල් කරන බවත්, ඒ බව දැන කළ යුතු නො කළ යුතු දෑ තමා ම නිදහස් ස්වාධීන චින්තනයෙන් තීරණය කළ යුතු බවත් කාලාම සූත්‍රයේ දැක් වේ. *(ඒථ තුම්හෙ කාලාමා අත්තනාව ජානෙය්‍යාථ ඉමේ ධම්මා අකුසලා ඉමේ ධම්මා සාවජ්ජා...)* මෙය ලෝකයේ ඕනෑම සමාජයකට ඕනෑම කාලයකට අදාළ කර ගත හැකි යථාර්ථය හා අනුරූප වන නිර්ණායකය කි.
- අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දැක්වෙන 'තමන්ට, අනුන්ටත් තමන් හා අනුන් යන උභය පක්ෂයටත්' හානි සිදුවන ක්‍රියා නො කිරීම. (*අත්තව්‍යාබාධාය පරව්‍යාබාධාය සංවත්තති. උභයව්‍යාබාධාය සංවත්තති).*
- අංගුත්තර නිකායේ එන තමා අධිපති කොට සිතීම, තමා අවට සමාජය අධිපති කොට සිතීම, ධර්මය අධිපති කොට සිතීම යන ආධිපත්‍යය ධර්මවලට අනුව කටයුතු කිරීම.
- අත්තුපනායික ධර්ම පර්යාය මගින් පැහැදිලි වන ආකාරයට තමා උපමා කොට ගෙන ක්‍රියාවෙහි ගුණ අගුණ විනිශ්චය කිරීම. *(අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ)*
- ධම්මපදයෙහි *'නතං කම්මං කතං සාධු...'* යනුවෙන් දක්වෙන පරිදි පසුතැවෙන විපාක සහිත ක්‍රියා නො කිරීම. *'නං ච කම්මං කතං සාධු...'* යනුවෙන් දැක්වෙන පරිදි මිහිරි සැනසිලිදායක ප්‍රතිඵල සහිතව ක්‍රියා කිරීම.
- ධම්මපදයේ යමක වග්ගයෙන් පැහැදිලි වන ආකාරයට කිලිටි සිතින් *(පදුට්ඨෙන චිත්තේන)* කටයුතු කිරීම හා ප්‍රසන්න සිතින් *(පසන්නේන චිත්තේන)* කටයුතු කිරීම ආදී සියලු නිර්ණායක කිසියම් කාලයකට හෝ දේශයකට පමණක් සීමා කළ හැකි නිර්ණායක නොව ඕනෑම කාලයකට ඕනෑම දේශයකට ගැළපෙන ලෝකයේ සම්මත සිද්ධීන් හා යථාර්ථය සමග නො ගැටෙන (සිද්ධිවාචක) නිර්ණායක වේ.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

5.

i. **දෙවන ධර්ම සංගායනාවට බලපෑ පසුබිම සැකෙවින් දක්වා ශාසන ඉතිහාසය තුළ දෙවන ධර්ම සංගායනාවේ වැදගත්කම ප්‍රකට කරන්න.** **(ලකුණු 10යි.)**

- දෙවන ධර්ම සංගායනාවට හේතු වී ඇත්තේ වජ්ජිපුත්තක භික්ෂූන් වහන්සේලා කරන ලද දසවස්තුව පිළිබඳ ඉදිරිපත් කිරීමයි. ***(නේන බෝ පණ සමයේන වස්සසත පරිනිබ්බුතේ භගවති වේසාලී වජ්ජිපුත්තකා භික්ඛූ වේසාලියං දසවත්ථූනී දීපෙන්ති)***
- කාලාන්තරයක් තිස්සේ භික්ෂූන් අතර වර්ධනය වූ මතභේදවල ප්‍රතිඵලය දස වස්තුව නිර්මාණය වීමට හේතු වී ඇත.
    1. ***කප්පති සිංගිලෝණ කප්පෝ*** - අඟක ලුණු තබාගෙන භාවිතා කිරීම කැපය
    2. ***කප්පති ද්වංගුල කප්පෝ*** - හිරු අවරට ගොස් සෙවණැල්ල දෑඟුලක් වනතුරු ආහාර අනුභවය කැපය
    3. ***කප්පති ගාමන්තර කප්පෝ*** - වරක් වළඳා අවසන් කොට වෙනත් ගමකට යන්නෙමැයි නැවත වැළඳීම කැපය
    4. ***කප්පති ආවාස කප්පෝ*** - මහා සීමාව තුළ පිහිටි කුඩා ආවාසයන්හි වෙන වෙනම පොහොය කර්ම කිරීම කැපය
    5. ***කප්පති අනුමති කප්පෝ*** - විනය කර්මවලට නොපැමිණි භික්ෂූන්ගේ අනුමතය පසුව ලබා ගන්නා රිසියෙන් සංඝ කර්ම කිරීම කැපය
    6. ***කප්පති ආචිණ්ණ කප්පෝ*** - ආචාර්යයන් වහන්සේලා විසින් පුරුදු කරන ලද කැප හෝ අකැප දෑ සියල්ල ඒ ලෙසටම පිළිගැනීම කැපය
    7. ***කප්පති අමථිත කප්පෝ*** - කිරිත් නොවූ දී කිරිත් නොවූ කිරි වැළඳීම කැපය
    8. ***කප්පති ජලෝගි පාතුං*** - නොපැසුණු සුරාපානය කැපය
    9. ***කප්පති අදසකං නිසීදනං*** - වාටි නොමැසූ ඇතිරිලි පරිහරණය කිරීම කැපය
    10. ***කප්පති ජාතරූපරජතං*** - රන් රිදී කහවණු පිළිගැනීම කැපය
- නිකායවලම්භන ශාස්ත්‍ර නම් ග්‍රන්ථයේ දැක්වෙන පරිදි මහාදේව හිමියන් විසින් ඉදිරිපත් කරන ලද රහතන් වහන්සේලා පිළිබඳ කරුණු පහ ද දෙවන ධර්ම සංගායනාවට හේතු වී ඇත.
- එවකට වෘද්ධතම ජ්‍යෙෂ්ඨ භික්ෂුව වූ සබ්බකාමී මා හිමියන්ට දස වස්තුව ගැන සැලවීමෙන් පසු ඒ ගැන විමසීමට යස හිමියන් විශාලා මහනුවරට යැවූ අතර එවිට වජ්ජිපුත්තක භික්ෂූන් දස වස්තුවේ දසවැන්න අනුව මුදල් සම්මාදමේ යෙදී සිටිනු දැක එයට එරෙහි වූ විට, එම වජ්ජිපුත්තක භික්ෂූන් යස හිමියන්ට පටිසාරණී හා උක්ඛේපතිය කර්මයෙන් දඬුවම් පැනවීමට සූදානම් විය.
- ද්විතීය සංගීතිය සඳහා මූලික ව ක්‍රියා යස තෙරණුවෝ ය. එහෙත් සංගායනා මණ්ඩපයෙහි සබ්බකාමී මහ තෙරණුවන් මූලිකත්වය දරූහ.
- රේවත ස්ථවිරයන් වහන්සේ විසින් සියලු ම භික්ෂූන් වහන්සේලාගෙන් ත්‍රිපිටකය කටපාඩම් තිබූ රහතන් වහන්සේලා 700ක් සංගායනාව සඳහා තෝරාගත්හ.
- දස වස්තුව විනිශ්චය කිරීමට මුලින් ම උබ්බාහිකාවක් පත් කළහ.
- කාලාශෝක රජුගේ පූර්ණ අනුග්‍රහය මේ සඳහා ලැබිණි.

- උබ්බාහිකාවෙන් දසවස්තුව ප්‍රතික්ෂේප වීමෙන් අනතුරු ව සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකට පසු ව දෙවන ධර්ම සංගීතිය විසාලා මහනුවර වාලුකාරාමයේ දී මාස අටක් මුලුල්ලේ පැවති බව

සංගායනාවේ ප්‍රතිඵල

- දස වස්තු ප්‍රතිග්‍රාහික දස දහසක් භික්ෂූන් අලජ්ජි පාපි භික්ෂූන් ලෙස නිගමනය කොට සසුනෙන් නෙරපූහ.
- විනය විරෝධීන් සසුනින් නෙරපා, ජ්‍යෙෂ්ඨ භික්ෂූන්ගේ මූලිකත්වයෙන් ශාසන සංශෝධනයක් කිරීම මෙම සංගීතියෙන් සිදු විය.
- දස වස්තුව පිළිබඳ සංගීති කාරක භික්ෂූන්ගේ තීරණය නොපිළිගත් වජ්ජි පුත්තක භික්ෂූන් සංගීති කාරක භික්ෂූන්ගෙන් වෙන් ව යාමෙන් මෙතෙක් නොබෙදී පැවති භික්ෂු සංවිධානය බෙදී ගොස් නිකාය භේදයට මුල පිරුණි.
- වෙන්ව ගිය භික්ෂූන් මහා සාංඝික නමින් නව නිකායයක් පිහිටුවා ගත් අතර මුල් භික්ෂූන් ථේරිය නමින් ප්‍රකට විය.
- මහා සාංඝිකයන් නැවත නිකාය 6කට ද, ථේරවාදීන් නිකාය 12කට ද, ආදි වශයෙන් නිකාය 18ක් ලෙස බෙදී ගියේ ය.
- මහායාන බුදු දහම ඇති වීමේ මූලාරම්භය දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයෙන් සිදු විය.
- ශාසන ඉතිහාසයේ වටිනා සන්ධිස්ථානයක් ලෙස දෙවන ධර්ම සංගායනාව සඳහන් කළ හැකි ය.

ii. **බුදුසසුනෙහි සංරක්ෂණය සහ ව්‍යාප්තිය විෂයෙහි කණිෂ්ක රජතුමාගෙන් සිදුවූ දායකත්වය පෙන්වා දෙන්න.** **(ලකුණු 10යි.)**

- හියුංසියෑංට අනුව මෙතුමා උපතින් හින්දු භක්තිකයෙකි.
- ගොපලු දරුවෙකු හමු වීමත් සමඟ ඇති වූ ආශ්චර්ය අත්භූත සිදුවීමක් නිසා බෞද්ධයකු බවට පත් කණිෂ්ක රජතුමා එම ගොපලු දරුවා විසින් කුඩාවට සකසන ලද චෛත්‍යයක් විශාල කොට සාදවන ලද බව සඳහන් වේ.
- බෞද්ධයකු බවට පත් කණිෂ්ක රජු දිනපතා සිය මාළිගයෙහි වියත් භික්ෂූන් ලවා ධර්ම දේශනා පවත්වන ලද බවත්, එම දේශනාවල දී භික්ෂූන් වහන්සේලා ධර්මය අර්ථකථනය කිරීමේ දී දක්වන වෙනස්කම් වටහාගත් රජු පාර්ශව වැනි වියත් භික්ෂූන් වහන්සේ සමග සාකච්ඡා කොට සිවුවන ධර්ම සංගායනාව සංවිධානය කරන ලද බවත් ෆාහියන් හා හියුංසියෑං වාර්තාවල දැක්වේ. කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ පැවති මෙම සංගායනාව පාර්ශව තෙරුන්ගේ නායකත්වය යටතේ පැවති අතර, එයට රජතුමාගේ පූර්ණ අනුග්‍රහය ලැබුණි.
- සිවුවන සංගායනාව පිණිස තත්කාලීන කීර්තිමත් සර්වාස්තිවාදී පඬිවරුන් වූ පාර්ශව, වසුමිත්‍ර, බුද්ධදේව වැනි තෙරවරුන්ගේ මෙන් ම, නාගාර්ජුන, අශ්වඝෝෂ වැනි මහායානික වියතුන්ගේ ද සහයෝගය ලබා ගත් බව සඳහන් වේ.
- රජු සියලු නිකායවලට අයත් කීර්තිමත් පඬිවරුන්ගේ අවවාද අනුශාසනා ලැබ රාජ්‍ය පාලනය සිදු කළේ ය.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- වියත් භික්ෂූන් වහන්සේ මෙතුමාගේ රාජ්‍ය සභාවේ ද කටයුතු කළහ.
- සිවුවන ධර්ම සංගායනාව අවසානයේ ත්‍රිපිටකයට විභාෂා ග්‍රන්ථ හෙවත් අටුවා රචනා කරන ලද අතර, ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දෙන ලදී.
- තව ද විභාෂා ග්‍රන්ථ තඹපත්වල ලියවා ශෛලමය මඤ්ජුසාවක බහා එය නිධන් කොට මහා සෑයක් ඉදිකරන ලදී. එම සෑය වර්තමානයේ පවා කාශ්මීරයේ දැකිය හැකි ය.
- සිවුවන ධර්ම සංගායනාවෙන් පසු කණිෂ්ක රජුගේ අනුග්‍රහයෙන් මධ්‍ය ආසියාව තුළ ධර්ම ප්‍රචාරක සේවාවක් ආරම්භ කරන ලදී.
- කණිෂ්ක රාජ්‍ය සමයේ භාවිත කාසිවල බුදුරුව ඇතුළත් කොට තිබීමෙන් මෙතුමා බුදුදහම පිළිබඳ දැක්වූ උනන්දුව පැහැදිලි වන අතර, බුද්ධ ප්‍රතිමාවේ ප්‍රභවයට අදාළව ද කණිෂ්ක යුගයේ භාවිත කාසි ඉතා වැදගත් සාධක ලෙස සැළකේ.
- ගන්ධාර බුද්ධ ප්‍රතිමා කලාව ආරම්භ වන්නේ ද මෙම රජුගේ කාලයේ මොහුගේ පාලන ප්‍රදේශයක් වූ ගන්ධාරයේ ය.
- පුරුෂපුරය (වර්තමාන පෙෂාවෝර් - පකිස්ථානය) තම රාජධානිය කොටගත් රජු එහි විශාල ආරාමයක් ඉදි කළේය.
- අවුරුදු හතලිස්දෙකක් වූ මෙතුමාගේ පාලන කාලයෙන් පසුව ද දීර්ඝ කාලයක් එම විහාර බුදුදහමේ චිරස්ථිතිය වෙනුවෙන් සක්‍රීය දායකත්වයක් සපයා ඇත.
- කණිෂ්ක රජතුමා විසින් අඩි 500 ක් උසැති විශාල චෛත්‍යයක් ගොඩනගා අටනැලියක පමණ ධාතු නිධන් කරන ලද බව සඳහන් වේ.
- කණිෂ්ක රජතුමා විසින් බුදුදහමට සිදු කරන ලද අපරිමිත මෙහෙවර නිසා එතුමා ද්විතීය ධර්මාශෝක නාමයෙන් ද හඳුන්වා ඇත.

6.

i. **ප්‍රාග් මහින්ද යුගයේ ලක්දිව ක්‍රියාත්මකව පැවති ආගම් පිළිබඳ නිදසුන් සහිතව පැහැදිලි කරන්න.** **(ලකුණු 10යි.)**

බ්‍රාහ්මණ ආගම

- විජය කුමාරයා ලංකාවට පැමිණීමේ දී තිස්ස නම් බමුණෙකු පැමිණ ඇති අතර පසුව උපතිස්ස ග්‍රාම නමින් බමුණු ගම පිහිටුවාගෙන ඇත.
- විජය කුමාරයාගේ මරණින් පසු පණ්ඩුවාසදේව ලංකාවට පැමිණෙන තෙක් ලංකාවේ පාලනය පිළිබඳව කටයුතු කොට ඇත්තේ උපතිස්ස බමුණා බව සඳහන් වේ.
- උන්මාද චිත්‍රා පිළිබඳ අනාවැකි ප්‍රකාශ කොට ඇත්තේ බමුණෙකි.
- පණ්ඩුකාභය කුමාරයාට ආරක්ෂාව සපයාදීම ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම නැවත රාජ්‍යත්වයට පත්වීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර දීම සිදුකර ඇත්තේ පණ්ඩුල නම් බමුණෙකි.
- පණ්ඩුකාභය රජතුමා රාජ්‍යත්වයට පත්වීමෙන් පසු පණ්ඩුල බමුණාගේ පුත් චන්ද්‍ර කුමාරයා පුරෝහිත තනතුරට පත් කරගෙන ඇත.
- පණ්ඩුකාභය රජතුමා පමුණන් උදෙසා සොත්ති ශාලා නම් ආගමික ගෘහ විශේෂය සිදුකොට ඇත.

- දේවානම්පියතිස්ස රාජ්‍ය අවධියේ දී ශ්‍රී මහා බෝධී ශාඛාව ලංකාවට වැඩමවන විට එහි පළමුවැනි පූජෝපහාරය සිදුකොට ඇත්තේ තිවක්ක නම් බමුණු ගම්දොරය.
- එසේ ම ශ්‍රී මහා බෝධියෙන් හටගත් අෂ්ඨඵලවලින් එක් බෝධීන් වහන්සේ නමක් තිවක්ක ගම පිහිටුවීම තුළ ද එකල බමුණු බලය ප්‍රබලව තිබූ බව පැහැදිලි ය.

ජෛන ආගම

- මහාවංසයට අනුව පණ්ඩුකාභය රජතුමා ජෝතිය, ගිරි, කුම්භණ්ඩ යන නිගණ්ඨයන් තිදෙනාට අසපු තුනක් සාදවා දී තිබීම.
- වළගම්බා රජු ගිරි නම් ජෛනයාගේ ආරාමය කඩා විනාශ කර අභයගිරිය ඉදිකළේ යැයි මහාවංසයේ සඳහන් වේ.
- මහාවංස අර්ථ විවරණයට අනුව තිස්ස, අභය සහ උත්තර නමැති කුමාරවරුන් තිදෙනාත් බල්ලාටනාග රජුගේ කාලයේ දී රජුට විරුද්ධව කැරලි ගසා ගිරි ආශ්‍රමයට වැද සිය දිවි නසාගෙන ඇති බව සඳහන් වේ.

ශිව ආගම

- පණ්ඩුකාභය රජුගේ කාලයේ දී 'සිවිකා ශාලා' නමින් ගොඩනැගිලි විශේෂයක් නිර්මාණය කර තිබිණි.
- පුද්ගල නාමයන් සඳහා 'ශිව' (මුටශිව/මහාශිව/චූලශිව/ගිරිඛණ්ඩශිව) යන නාමය භාවිතකොට තිබීමෙන් ද එකල ශිව ආගම ප්‍රචලිත ව පවතින්නට ඇතිබව සිතිය හැකි ය.
- බුදු සමය පැමිණීමෙන් පසුත් ලක්දිව ශිව වන්දනාව පවත්වාගෙන ගොස් ඇත.

පරිබ්‍රාජක හා ආජීවක සම්ප්‍රදායන්

- පණ්ඩුකාභය රජු පරිබ්‍රාජකයන්ට ආරාම ඉදිකරවා දී තිබිණි.
- විජය කුමරු ලංකාවට පැමිණි අවස්ථාවේ දී පිරිත් නූල් බැඳ පරිබ්‍රාජක පිරිසක් විසින් පිළිගෙන ඇති බව මහාවංශයේ සඳහන් වේ.
- භද්දකච්චායනා ඇතුළු පිරිස පරිබ්‍රාජක වේශයෙන් මෙරටට පැමිණ ඇත.
- පණ්ඩුකාභය රජු ආජීවකයන් සඳහා ගෘහයක් කර දී ඇත.

බුදු දහම

- බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් නවවන මාසයේ දී දුරුතු පොහොය දිනක මහියංගණයට ද,
- බුද්ධත්වයෙන් පස්වන වර්ෂයේ බක්පුර පසළොස්වක් පොහොය දිනයේ බුදුරජාණන් වහන්සේගේ දෙවන ලංකාගමනය නාගදීපයට ද,
- බුද්ධත්වයෙන් අටවන වසරේ දී බුදුරජාණන් වහන්සේ තෙවන වරට කැළණියට වැඩම කිරීම හා එම ගමනේ දී ම ශ්‍රී පාදස්ථානය වැනි ස්ථානවලට ද වැඩම කොට එම ස්ථාන පූජනීයත්වයට පත් කර ඇත.
- තපස්සු භල්ලුක වෙළෙන්දන් විසින් තිරියායේ ගිරිහඬු සෑය නමින් ස්තූපයක් කරවීම.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- මහින්දාගමනයට පෙර ධර්මාශෝක රජු විසින් දෙවන පෑතිස් රජුට තෙරුවන් සරණ යන ලෙස හසුන් එවා ඇත.
  මෙවැනි කරුණු පදනම් කරගෙන පිළිතුර සකස්විය යුතුය.

ii. **මහින්දාගමනයෙන් පසුව ලාංකීය රජවරුන්ගෙන් සිදු වූ ශාසනික සේවය දේවානම්පියතිස්ස සහ දුටුගැමුණු රජවරුන්ගේ සේවාවන් ඇසුරින් පහදන්න. (ලකුණු 10යි.)**

දේවානම්පියතිස්ස රජතුමා

- මෙතුමා රාජ්‍ය පාලනය ගෙන යන සමයෙහි භාරතයේ රාජ්‍ය පාලකයා වූ ධර්මාශෝක රජතුමාගේ පුත් වන මිහිඳු මාහිමිපාණන් සහ දූත පිරිස අනුරාධපුරයෙන් නැගෙනහිර දෙසට පිහිටි මිස්සක පව්වට පොසොන් පුන් පොහෝ දින වැඩම කළහ.
- මෙහි දී මිහිඳු මහරහතන් වහන්සේ සහ රජතුමා අතර පැවති බුද්ධිගෝචර පිළිසඳර කතාබහෙන් පසු චුල්ලහත්ථිපදෝපම සූත්‍රය ඇසුරෙන් ධර්ම දේශනා කළහ.
- දේශනාවසානයෙහි රජතුමාත් සතළිස් දහසක් පිරිසත් බුදුදහම වැළඳ ගත්හ. මේ සිද්ධියත් සමග ලක්දිව බුදුදහම වැලඳගත් ප්‍රථම රජතුමා බවට දේවානම්පියතිස්ස රජතුමා පත් වුයේ ය.
- දේවානම්පියතිස්ස රජතුමා මහා මේඝවනෝද්‍යානය බුදු සසුන උදෙසා පූජා කරන ලදී. එය ලක්දිව පළමු ආරාම පූජාව යි.
- දේවානම්පියතිස්ස රජතුමා ශාසනයෙහි ව්‍යාප්තිය හා චිරකාලීන පැවැත්ම වෙනුවෙන් තවදුරටත් ඇප කැප වෙමින් කාන්තා පැවිද්ද ලංකාවෙහි පිහිටුවීමට ක්‍රියා කෙළේ ය. රාජානුග්‍රහය ලබා දී සංඝමිත්තා තෙරණිය වැඩම කරවා අනුලා දේවිය ඇතුළු කාන්තාවන් පන්සිය දෙනෙකුට භික්ෂුණී පැවිද්ද ලබා දීමට එතුමා පියවර ගත්තේ ය.
- දෙවන පෑතිස් රජු විනය සංගායනාවක් පවත්වා ශාසන චිරස්ථිතිය වෙනුවෙන් ක්‍රියා කෙළේ ය. එම සංගායනාව සඳහා රහතන් වහන්සේලා හැට අටනමක් සමග දහසක් භික්ෂු සමූහයා සහභාගි කරවූහ. ථූපාරාමයේ දී පැවැත් වූ මෙම සංගීතියට දේවානම්පියතිස්ස රජතුමා නො මඳ ව දායකත්වය ලබා දුන්නේ ය.
- දෙවනපෑතිස් රජතුමාගේ සුවිශේෂී ශාසනික සේවාවන් අතර ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවීම දැක්විය හැකිය.
- එතුමන් විසින් අරිට්ඨ කුමරු ඇතුළු දූත පිරිසක් මිහිඳු මහ රහතන් වහන්සේගේ උපදේශකත්වය යටතේ භාරතයට පිටත් කර යවා සංඝමිත්තා මහ රහත් මෙහෙණින් වහන්සේගේ මාර්ගයෙන් ශී මහා බෝධීන් වහන්සේ මහත් හරසරින් වැඩමවා උඩ මලුවේ රෝපණය කරවනු ලැබූහ.
- එම අවස්ථාවේ දී මතු වූ බෝධීන් වහන්සේලා අට නමක් ථූපාරාමය, ඉසුරුමුණිය, කතරගම ආදී ස්ථාන අටක රෝපණය කිරීමට දේවානම් පියතිස්ස රජතුමා පියවර ගත්තේ ය.
- මෙතුමා චේතියගිරියේ අට සැටලෙන ඉදිකර මිහිඳු හිමියන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලාට වස් විසිමට පහසුකම් සැලසීය.
- උපාසිකාරාම හා වෙහෙර විහාර සමූහයක් කරවා ලක්දිව බුදු සසුන ස්ථාපිත කිරීමටත් ව්‍යාප්ත කිරීමටත් පියවර ගත්තේ ය.

- භික්ෂු භික්ෂුණී යන දෙපාර්ශවයේ ම සුබ විහරණය පිළිබඳ නිරතුරු ව සොයා බැලූ රජතුමා සංඝමිත්තා තෙරණිය ඇතුළු භික්ෂුණීන් වහන්සේලා උදෙසා උපාසිකා විහාර නම් ප්‍රසිද්ධ මෙහෙණවර ඉදි කළ අතර චූලාංගන, මහාංගන, සිරිවඩ්ඪ යන මන්දිරවලින් එම උපාසිකාරාමය සංවර්ධනය කිරීමට ද පියවර ගෙන ඇත.
- හත්ථාල්හක මෙහෙණවර, ථූපාරාමය, ඉසුරුමුණි විහාරය", මහාපාලි දාන ශාලාව, දඹකොළ වෙහෙර, තිස්සමහා විහාරය", පාචීනාරාමය" යන පූජනීය ස්ථාන ද දෙවන පෑතිස් රජතුමාගේ රාජ්‍ය අනුග්‍රහය මත ඉදි වූ වැදගත් ආගමික ස්ථානයන් ය.

දුටුගැමුණු මහ රජතුමා

- බුදුදහම කෙරෙහි අධික ප්‍රසාදයෙන් හා ගෞරවාදරයෙන් ක්‍රියා කළ විශිෂ්ට පාලකයෙකි.
- මෙතුමා ත්‍රිවිධ රත්නය විෂයයෙහි නිරන්තරයෙන් ශ්‍රද්ධාවෙන් කටයුතු කළ, පරමාදර්ශී පාලකයෙකි.
- මහා සංඝරත්නය කෙරෙහි ගෞරව බහුමානයෙන් යුතු ව ක්‍රියා කළ රජතුමා අර්බුදකාරී යම් අවස්ථාවක් උදා වුවහොත් භික්ෂූන් වහන්සේලාගේ උපදේශකත්වය ලබා ගනිමින් ඒ අනුව කටයුතු කෙළේ ය.
- රජු තම සොහොයුරු තිස්ස කුමරු සමඟ සටන් වැදීමට සූදානම් වූ අවස්ථාවේ දී තිස්ස කුමරු දුටුගැමුණු රජුගෙන් බේරීමට ආරාමයකට ගොස් භික්ෂූන් වහන්සේලා අතර සැඟ ව සිටියේ ය. මේ පිළිබඳ ව රජු දැනගත් නමුත් සංඝයා කෙරෙහි ඇති වූ ගෞරවය හේතුවෙන් සිය සොහොයුරු තිස්ස කුමරු සමග පැවති විරසකය අවසන් කෙළේ ය. මෙම ගැටුම සමථයකට පත් කරගැනීම උදෙසා දුටුගැමුණු රජුට උපදේශකත්වය ලබා දෙන ලද්දේ ගෝධගත්තතිස්ස තෙරුන් වහන්සේ විසිනි.
- කලහය සංසිඳලීමට උන්වහන්සේ වැඩම කිරීමෙන් පසු මෙතුමා ප්‍රකාශ කෙළේ, ''අප ඔබ වහන්සේලාගේ දාසයන් බවත් සත් හැවිරිදි සාමණේර කෙනෙක් එව්වාහු නම් අප අතර කලහයක් නො වන බවත්"ය. මෙමගින් රජතුමා භික්ෂූන් විෂයයෙහි දක්වන්නා වූ අතිමහත් ගෞරවාදරය පිළිබිඹු වේ.
- ගැමුණු රජු හා ඔහුගේ සහෝදර තිස්ස කුමරුන් නිරන්තරයෙන් ම මෙලෙස සංඝයා කෙරෙහි ගෞරවාදරයෙන් ක්‍රියා කිරීමට යොමු කෙළේ එතුමන්ලාගේ පියාණන් වූ කාවන්තිස්ස රජතුමා ය.

- බුදු සසුන කෙරෙහි ලැදියාවෙන් ක්‍රියා කළ දුටුගැමුණු රජුගේ පරම අභිලාෂය වූයේ සතුරන්ගෙන් රට හා ශාසනය ආරක්ෂා කර ගැනීමත් මුලු ජීවිත කාලය ම බුද්ධ ශාසනයෙහි අභිවෘද්ධිය පිණිස දිවිහිමියෙන් කැපවීමත් ය.

- ස්වාර්ථය පසෙක ලා බුදු සසුනේ චිරාත්කාලීන පැවැත්ම වෙනුවෙන් තම දිවි පරදුවට තබා ක්‍රියාකිරීමට දුටුගැමුණු රජු පෙලඹුණේ ය. ''මාගේ මේ ව්‍යායාමය කිසි කලෙකත් රජ සැප පිණිස නො වන්නේ ය. මාගේ මේ උත්සාහය බුද්ධ ශාසනයාගේ පිහිට වීම පිණිස මැයි." යන ගැමුණු රජුගේ ප්‍රකාශනයෙන් එතුමාගේ මූලික පරමාර්ථය මැනවින් වටහාගත හැකි ය.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- සම්බුද්ධ ශාසනයෙහි උන්නතිය කෙරෙහි කැප වූ දුටුගැමුණු රජු වෙහෙර විහාර ඉදි කරන ලදී. ඒ අතුරින් 'මිරිසවැටි වෙහෙර' ප්‍රමුඛ වේ. රජතුමා භික්ෂූන් වහන්සේලා උදෙසා කොටසක් වෙන් නො කොට මිරිස් ආහාරයක් අනුභව කිරීමේ වරදට දඬුවමක් වශයෙන් මිරිසවැටිය ඉදි කළ බව සඳහන් වේ.

- මහල් නවයකින් යුත් ලෝවාමහා ප්‍රාසාදය දුටුගැමුණු රජතුමා ඉන් අනතුරුව ඉදි කළ පූජනීය ස්ථානය යි. මෙය භික්ෂූන් වහන්සේලාගේ සුඛ විහරණය වෙනුවෙන් ඉදි කළ උපෝසථාගාරයකි. මේ සඳහා කෝටි තිහක මුදලක් වැය කොට ඇතැ යි සැලකේ.

- ලක්දිව බුදු සසුන ව්‍යාප්ත කිරීමටත් ලක්දිව බුදු සසුන මුල්බැස ගැනීම සඳහාත් දුටුගැමුණු රජතුමන් විසින් ඉටු කළ මහඟු කාර්යභාරය අද්විතීය වේ.

- මහා ථූපය හෙවත් රුවන්මැලි සෑය දුටුගැමුණු රජුගේ සුවිශේෂී නිර්මාණකි. වෙසක් මස පුර පසළොස්වක පෝය දිනක ආරම්භ කළ මෙම අග්‍රගණ්‍ය ථූපය වෙනුවෙන් රජතුමාගේ අවසන් හුස්ම පිට වන තුරු ම මුළු ජීවිතය ම කැප කෙළේ ය. අතීතයේ සිට වර්තමානය දක්වා ම රුවන්මැලි මහා සෑය බුදු සසුන හා අත්‍යන්තයෙන් බැඳී පවත්නාවූත් ලක්වාසී බෞද්ධ ජනතාවගේ නිරතුරු වැඳුම් පිඳුම් ලබන්නාවූත් පූජනීය පින්බිමක් බවට පත්කිරීමේ ගෞරවාදරය දුටුගැමුණු රජුට හිමි වේ.

- දුටුගැමුණු රජු විසින් වෙහෙර විහාර අනූ නවයක් කරවන ලද බව ද සඳහන් වේ.

- මෙම රජතුමා බුදු සසුන කෙරෙහි පවත්නා අසීමිත ගෞරවාදරය නිසා ම ආහාර පාන ගැනීමට පළමුව භික්ෂූන් වහන්සේලාට දන්දීමේ සිරිතක් පවත්වාගෙන ගියේ ය.

- ඉතා දුෂ්කර අවස්ථාවල දී පවා එතුමා මෙම උතුම් කාර්යය සිදු කර ඇත. තිස්ස නම් තෙරුන් වහන්සේ නමකට දුෂ්කර අවස්ථාවක දී දන් පිළිගැන්වූ අවස්ථාවක් පිළිබඳවත්, කුණ්ඩලාභරණයක් විකුණා පන්සියයක් භික්ෂූන් වහන්සේලාට දන් පිරිනැමීමක් පිළිබඳවත් පුරාවෘත්තයන් හි සඳහන් වේ.
- මීට අමතර ව කඨින පූජාව, අරියවංස උත්සවය, වෙසක් උත්සවය ආදී ආගමික උත්සවයන් ද දුටුගැමුණු රජතුමා විසින් ඉතා උසස් ලෙස සිදු කරන ලදී.
- එතුමා වෙසක් උත්සව විසි හතරක් පැවැත් වූ බව කියැවේ. මෙලෙසින් ආගමික උත්සව පැවැත් වූ දුටුගැමුණු රජතුමා ලක්දිව සියලුම භික්ෂූන් වහන්සේලා උදෙසා තුන් අවස්ථාවක් තුන් සිවුරු පූජා කර ඇති අතර ලක් රජය පස් වතාවක් බුදු සසුනට පූජා කෙළේ ය.

7.

i. **තායි සංස්කෘතිය බුදු දහමින් පෝෂණය වූ ආකාරය සාකච්ඡා කරන්න.** **(ලකුණු 10යි.)**

- බටහිර ජාතීන්ගේ ආධිපත්‍යයට යටත් නොවූ ආසියාවේ එක ම රට වූ තායිලන්තය නිදහස් දේශය යන නමින් විරුදාවලියට පත් වන අතර එය අතීතයේ සියමය ලෙස ද හැඳින්විය.
- තෙවන ධර්ම සංගායනාවෙන් පසුව නව රට සසුන් පිහිටුවීමේ දී ස්වර්ණ භූමියට වැඩම කළ සෝණ - උත්තර හිමිවරුන් විසින් තායිලන්තයට බුදුසමය හඳුන්වා දෙන ලදුයි එරට ජනතාවගේ පිළිගැනීම ය.
- යුග හතරක් ඔස්සේ ථායි බුදු දහම සංවර්ධනය විය.
- පළමු යුගය ලෙස ක්‍රි.පූ. 329 දී නකොම් පථොම් නගරය ආශ්‍රිත ව ථෙරවාදී බුදුදහම ව්‍යාප්තව පැවති බව ඉතිහාසයේ සඳහන් වන අතර මින් සියවස් කිහිපයකට පසු ව බැංකොක් නගරයට බටහිරින් පිහිටි පොංටන් හා පාපථෝම් යන ස්ථානයන්හි දී හමු වී බෞද්ධ පුරාවස්තු මඟින් එම තොරතුරු තහවුරු කෙරේ.
- දෙවන යුගයෙහි ආරම්භය ලෙස සැලකෙන්නේ ක්‍රි.ව.700 දී පලම්භාන් රජුගේ අනුග්‍රහයෙන් මහායාන බුදුසමය ව්‍යාප්ත වූ අවධිය යි.
- ක්‍රි.ව. 11 වන සියවසෙහි බුරුමයෙහි පාලක අනෞරථ රජුගේ අනුග්‍රහයෙන් බුද්ධ ධර්මය ව්‍යාප්ත වීම තෙවන අවධිය ලෙස සැලකේ.
- ශ්‍රී සූර්යවංශ රාම මහා ධාර්මික අධිරාජතුමන් ක්‍රි.ව. 1361 දී සියම් භික්ෂු පිරිසක් ලංකාවට එවා මෙරට දී බුදුදහම මැනවින් ඉගෙන ගැනීමෙන් අනතුරු ව නැවත එරටට ගෙන්වා ගෙන බුදුදහමේ අභිවෘද්ධියක් ඇති කරලීමට කටයුතු කිරීම හතර වන අවධිය ලෙස සැලකේ.
- හියුං සියැංගේ වාර්තාවලට අනුව ක්‍රි.ව. 7 වන සියවසේ ද්වාරවතී රාජ්‍යයේ බුදුසමය සමෘද්ධිමත් ව පැවති තිබිණි.
- මොන්කුන් රාජ්‍ය සමයේ සියම් නිකාය පමණක් පැවති අතර පසු ව මෙම නිකාය මහා නිකාය හා ධම්ම යුත්තික නිකාය වශයෙන් කොටස් දෙකකට වෙන් වී තිබේ.
- බුදුදහම නඩත්තු කිරීම, ආරක්ෂා කිරීම රාජ්‍ය යුතුකමක් ලෙස සැලකෙන අතර රජයේ ප්‍රධානියා බෞද්ධයකු විය යුතු ය.
- බෞද්ධ විහාරාරාම පාලනය කිරීම, රජයේ පාලනයට යටත් වන අතර විහාරස්ථානවල ආගමික කටයුතු සඳහා අවශ්‍ය සියලු වියදම් රජය විසින් දරයි.
- ක්‍රමවත් සංඝ සංවිධානයක් පවතින අතර එහි ප්‍රධානියා රජය විසින් පත් කරන ලද සංඝ රාජයන් වහන්සේ නමකි.
- තායි පිරිමින් ටික කලකට හෝ පැවිදි වී සිටීම චිරාගත සම්ප්‍රදායයක් වන අතර පැවිදි වීම හා උපැවිදි වීම උත්වශ්‍රීයෙන් සිදුවන බව ද, එම තාවකාලික පැවිද්දේ දී හමුවන සහතිකය විවාහ වීමේ දී හා රැකියා ලැබීමේ දී විශේෂ සුදුසුකමක් සේ සැලකේ.
- ඔනා ගිහිපැවිදි සම්බන්ධතාවක් පවතින අතර තායි භික්ෂූන් වහන්සේලා ශිෂ්‍යයන් තුළ ආධ්‍යාත්මික අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන අතර ම ලෞකික ජීවිත ගැටලුවලට ද විසඳුම් සැපයීම සිදු කරයි.
- තායි ජනතාව දෛනික ව ආගමික කටයුතුවල නිරත වීමට අවශ්‍ය පූජාසනයක් කාමරයක සකස් කරගෙන එම පූජා කටයුතුවල නිරත වේ.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- තායි රටේ ලොකු කුඩා සැම අයෙකුගේ ම ගෙලෙහි බුද්ධ රූපයක් පැළඳගෙන සිටීම සුලබ දසුනක් වන අතර එය සකස් කරනු ලබන්නේ භික්ෂූන් වහන්සේලා විසිනි.
- තායි විහාරස්ථානවල පැවිදි පිරිස් මෙන් ම බහුල ව ළමයින් ද වාසය කරති.
- වාර්ෂික ව පැවැත්වෙන උත්සව අතර වෙසක් උත්සවය හා කඨින පූජෝත්සවය ප්‍රමුඛ තැනක් ගන්නා අතර කඨින චීවරය ගෙන යන පෙරහැර ජාතික ක්‍රීඩාවලින් සමන්විත වේ.
- තායි රජතුමා කිසියම් විහාරයක කඨින පිනකමට සහභාගි වීම අනිවාර්ය ය.
- අධ්‍යාපනය කලා ශිල්ප හා සාහිත්‍යය ද බුදු දහමින් පෝෂණය වී සංස්කෘතිය පෝෂණය කරලීමට දායකත්වයක් ලබා දී ඇත.

ii. **ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා කලාවේ ආරම්භය සහ විකාශය විමර්ශනය කරන්න. (ලකුණු 10යි.)**

- මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනයෙන් අනතුරුව ලාංකේය ප්‍රතිමාකරණයේ ආරම්භය පිළිබඳ තොරතුරු සපයන ප්‍රධාන ම මූලාශ්‍රය වන්නේ මහාවංශය යි.
- දේවානම්පියතිස්ස රජතුමා ථූපාරාමයේ තැන්පත් කළ ශෛලමය බුද්ධ ප්‍රතිමාව පළමු වන ජෙට්ඨතිස්ස රජතුමා (ක්‍රි. ව. 266-276) පැදුම්තිස්පව්ව විහාරයට ගෙන ගොස් තැන්පත් කර ඇත. මෙහි එන පැදුම්තිස්පව්ව විහාරය නම් පාචීනතිස්ස පබ්බත විහාරය යි.
- එසේ ගෙනගිය ශෛලමය බුද්ධ ප්‍රතිමාව මංගල සිලාපටිමා නමින් ද, එවකට තිබූ විශාල බුදුපිළිමය බැවින් උරුසිලා පටිමා නමින් ද, හැඳින්විණි. එය හිඳි පිළිමයකි.
- පළමුවන ජෙට්ඨතිස්ස රජුගේ සහෝදරයා වූ මහාසේන රජු (ක්‍රි. ව. 276-303) එම ප්‍රතිමාව එතැනින් අභයගිරි විහාරයට ගෙන ගියේ ය. එම ප්‍රතිමාව සඳහා ඔහු පිළිමගෙයක් ද කරවූයේ ය.
- බුද්ධදාස රජතුමා (ක්‍රි. ව. 340-368) එම ප්‍රතිමාවෙහි නෙත්වල මැණික් එබ්බ වී ය.
- ධාතුසේන රජතුමා (ක්‍රි. ව. 459-477) එම මැණික් අතුරුදහන් ව ඇතිබව දැන නැවත මැණික් ඔබ්බවා නේත්‍ර පිළිසකර කර වී ය. එම ප්‍රතිමාවට රැස්වළල්ලක් ද කර වී ය. හිසකෙස් සඳහා ඉඳුනිල් මැණික් ඔබ්බවන ලදී. ප්‍රතිමාව තැන්පත් කිරීමට ප්‍රතිමා ගෘහයක් ද කරවන ලදී.
- ශිලාමේඝවණ්ණ රජතුමා (ක්‍රි. ව. 623-632) පැරණි ප්‍රතිමා ගෘහය යළිත් ප්‍රතිසංස්කරණය කර වීය. ඊට ඉලන්ද වැව පූජාකර නානාවිධ ආරක්ෂා සලස්වා උත්සව ද පැවැත් වී ය.
- පළමුවන සේන රාජ්‍ය කාලයේ (ක්‍රි. ව. 833-853) පාණ්ඩ්‍යයෝ ලංකාව ආක්‍රමණය කළහ. ඔවුහු රාජ්‍ය භාණ්ඩාගාරයෙහි තිබූ සියලු දෑ කොල්ලකා සලපිළිමයෙහි තිබූ නෙත්වලට යොදා තිබූ මැණික් දෙක ද ගෙන ගියහ. නැවත දෙ වන සේන රජු (ක්‍රි. ව. 853-887) ජරාවාසව තිබූ එම ප්‍රතිමා ගෘහය ප්‍රතිසංස්කරණය කෙළේ ය.
- ඊට අමතර ව හතර වන මිහිඳු රජුගේ (ක්‍රි. ව. 956-972) මිහින්තලා පුවරු ලිපියේ 'මඟුමහසලපිළිමගෙහි' (මංගල මහා ශෛල ප්‍රතිමාව) යනුවෙන් ද එම රජුගේ ම ජේතවන පුවරු ලිපියේ 'මහින්ද් මහා සල්පිළිමෙ' (මහසල ප්‍රතිමාව) යනුවෙන් ද මේ පිළිබඳ ව සඳහන් කර ඇත.
- පළමුවන කාශ්‍යප රාජ්‍ය කාලයේ (ක්‍රි. ව. 477-495) මිගාර නම් සෙනෙවි තෙමේ අභිෂේකයට සලපිළිමය ඉල්ලුව ද ඊට අවසර නො ලැබුණි. ඒ අනුව එම ශෛලමය බුද්ධ ප්‍රතිමාව ඉතා වැදගත් එකක් සේ සලකා ඇතිබව පැහැදිලි වේ.

- ක්‍රි.ව. පස් වන ශතවර්ෂයේ දී ලංකාවට වැඩම කළ පාහියන් හිමි අභයගිරියේ වැඩ සිටිනා බුදු පිළිමයක් තිබූ බවත් එහි සම්පූර්ණ ප්‍රතිමාව ම සප්ත රත්නයෙන් කාන්ති විහිදුවමින් බැබැළ වූ බවත් දක්වා ඇත. ඉසෙඩ් වික්‍රමසිංහගේ අදහසට අනුව ෆාහියන් හිමියන් විසින් දක්නා ලද ප්‍රතිමාව ඉහත කී සලපිළිමය යි.
- ලංකා බුද්ධ ප්‍රතිමාව පිළිබඳ ප්‍රථම වරට ග්‍රන්ථාරූඪ වාර්තාවක් ලැබෙන්නේ මහාවංශයෙහි වාර්තාගත රුවන්වැලි මහසෑය කර වූ දුටුගැමුණු රජතුමා පිළිබඳ ව එන විස්තරය තුළ ය. එයට අනුව දුටුගැමුණු රජතුමා රුවන්වැලි සෑයේ ධාතු ගර්භයේ ඉතා අලංකාර රුවන්මුවා බෝ රුකක් කරවා ඊට නැගෙනහිරින් පණවන ලද ආසනයෙහි රන්මුවා බුදුපිළිමයක් තබා ඇත.
- තව ද මහාථූපයෙහි ධාතු නිධානෝත්සවයේ දී එම ධාතූන් වහන්සේලා අහසට නැග දෙතිස් මහ පුරුෂ ලක්ෂණයෙන් හා අසූ අනුව්‍යාංජනයෙන් බබළන්නා වූ බුද්ධවේශය රැගෙන ගණ්ඩබ්බමූලයෙහි සර්වඥයන් වහන්සේ මෙන් ජීවමාන වූ සම්බුදුන් ලෙස යමාමහ පෙළහර පෑ බව සඳහන් වේ.
- වසභ රජු දවස (ක්‍රි. ව. 65-109) ශ්‍රී මහ බෝධිමළුවෙහි සතර බුදුවරයන්ගෙන් පිළිම හා ඒ සඳහා රම්‍ය වූ පිළිම ගෙවල් ද කර වූ බව සඳහන් වේ.
- ගෝඨාභය රජු (ක්‍රි. ව. 253-266) ශ්‍රී මහා බෝධියෙහි දොරටු තුනක සෙල්මුවා පිළිම තුනක් කර වී ය.
- මේ අනුව ක්‍රි. පූ. 140 දී දුටුගැමුණු රජු කාලයේ මහාසෑය ගොඩ නැගීමේ දී බුද්ධ ප්‍රතිමාව හා බුදුරුව නිරූපණය කිරීම ගැන සඳහන් වන බවත් ක්‍රිස්තු වර්ෂ තෙ වන සියවස අගභාගය වන විට මෙරටෙහි බුදු පිළිම නිර්මාණය ඉතා උසස් තැනකට පත්ව තිබිණි.

8.

i. **බෞද්ධ සංකල්ප ජනගත කිරීමට ජන කවියා දක්වන ලද නිපුණතාව නිදසුන් මගින් ප්‍රකට කරන්න.** **(ලකුණු 10යි.)**

- සිංහල ජනකවි කෙරෙහි බෞද්ධ ආභාසය ඉතා ඉහළින් ලැබී ඇත.
- වෘත්තීයමය කටයුතුවල නියැළෙන අතරතුර ගැමියා සිය ගතට සිතට දැනෙන විඩාව පහ කර ගනු වස් ගෙතූ ජන කවිවල සංකීර්ණ අර්ථ නිරූපණයකට වඩා සරල දහම් කරුණු කියාපෑමක් දක්නට ලැබේ.
- සාමාන්‍ය ජීවිත ගත කරන ජනතාව ධර්මය ඔස්සේ ජීවිතය දෙස බලනුයේ නිරායාසයෙනි. මිනිස් ජීවිත වටා ගෙතුණු විවිධ මිහිරි හා අමිහිරි සිදුවීම් ආදිය පින පව අතර දෝලනය වන බව කියාපෑම ද අරමුණක් වන්නට ඇත.
- රසවත් ආහාර නොවළඳමින්, බොරදිය පානය කරමින්, මහා කළු ගලක් යට ගෙවන අන්ධකාර ජීවිතයක් උරුම වූවෙකුගේ දුක්බිත කටුක අත් දැකීම පූරුවෙ කළ පවක් නිසා ලබන්නට වූ බව කියයි. 'බොන්නෙත් බොර දියයි පූරුවෙ කළ පවට' යනුවෙන් කවියා කරන ලද ප්‍රකාශයෙන් තමා විඳින දුක් ගැහැට පෙර ආත්මයන්හි කරන ලද කර්ම ඵල විපාකවල ප්‍රතිඵලයක් බව පසක් කර ගනී.

ඉන්නෙත් දුම්බරයි මහ කලු ගලක් යට
කන්නෙත් කරවලයි රට හාලේ බතට

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

බොන්නෙත් බොර දියයි පූරුවේ කළ පවට
යන්නේ කවදා ද මවුපියෝ දකින්නට

- බුදුදහමට අනුව මිනිසා පමණක් නොව සියලු ම සතුන් මෙලොව පරලොව වශයෙන් කිසියම් සැපක් හෝ දුකක් විඳින් ද ඒ පූර්ව භවයන්හි දී කරන ලද කුසල් අකුසල් වල ප්‍රතිවිපාකයක් ම වන බව 'තණ්ඩලේ දෙන්නා දෙපොලේ දක්කනවා' යන කවියෙන් කියැවේ.
- ගැමි ජනතාවට සසර ගමන දුකකි යන්න පසක් කරමින් ධර්මය මෙනෙහි කරන්නට අවස්ථාවක් උදාකර දීම මෙහි දී දක්නට ලැබේ.
- සංසාර ගමන පුරා පිං පව් අප පසු පස එන්නේ ගොනා බැඳි කරත්තයේ රෝදය ගොනා පසුපස එන්නා සේ ය. 'හපුතලේ කන්ද දැකලා බඩ දනවා - පව්කළ ගොනෝ ඇදපන් හපුතල් යනවා' යනුවෙන් පව් කිරීමෙහි විපාක විඳීමට සිදු වනබව දක්වයි.
- සිය මවට අත්විඳින්නට සිදු වී ඇති බේදනීය තත්ත්වය දෙස කම්පාවෙන් බලා සිටින වැඩිමහල් සොහොයුරෙකු සිය මල්ලීට අවවාද කරනු ලබන්නේ බුදුන් වහන්සේ ද සිහිපත් කරමිනි. සිය මව සතු සියලු දෑ නිර්ලෝභී ව සමාන ව ඔවුන් දෙදෙනාට ලබා දුන් ආකාරය සිහිපත් කරන කවියා මවට හිරිහැර කරදර නො කොට බුදුන් වහන්සේට වඳින අයුරින් ම ඇයට ද වන්දනාමාන, ගරුබුහුමන් කරන ලෙස ධර්මානුකූල ව පහදා දීමට මෙම කවියෙන් උත්සාහ ගෙන ඇත.

  මල්ලියේ ඔහොම නොකරන් අපෙ අම්මාට
  දෙතනේ කිරි දුන්නෙත් අපි දෙන්නාට
  තියෙන දෙයක් දෙන්නෙත් අපි දෙන්නාට
  බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට

- ජන කවියා සිය කවියට බුදු දහමේ සංකල්ප යොදා ගෙන ඇති අපූර්වත්වය බොහෝ ජන කවිවලින් පැහැදිලි වේ. මරණින් මතු නිවන අපේක්ෂා කිරීම බෞද්ධ සමාජයේ පොදු ලක්ෂණයකි. බෞද්ධයාගේ ඒකායන අරමුණ අමාමහ නිවනින් සැනසීම ය.
- ඕනෑම පුද්ගලයෙකු හෝ සතෙකු මිය ගිය පසු බෞද්ධ ජනයාගේ සිතුවිල්ල වන්නේ ඔවුන් නිවනට යා යුතු බවයි. බෞද්ධාභාසය මුසු කරමින් කවියා 'නිවන් පුරේ පලයන් තලගොයි පැටියා' යනුවෙන් තිරිසන් සතාට ද උතුම් වූ නිර්වාණය ප්‍රාර්ථනා කර ඇති ආකාරයෙන් ඒ බව පැහැදිලි වේ.

  මා බාලේ ඇති කළ තලගොයි පැටියා
  මා තනියට මිදුලේ පෙම් කෙළ සිටියා
  නපුරු සතෙක් ඇවිදින් ඌ අරන් ගියා
  නිවන් පුරේ පලයන් තලගොයි පැටියා

- ආගමික වටපිටාවක ජීවත් වන ගැමි ජනතාව සිය ජීවිත වටා පැතිර පවතින බාහිර ලෝකයේ ආගමික පරිසරයෙහි පවත්නා නිරාමිස සෞන්දර්ය හදවතින් ම විඳිනු ලබයි. එම සුන්දරත්වය චමත්කාර ජනක ලෙස ගීයට නැගීමක් 'ඔන්න මලේ ඔය නා මල නෙලා වරෙන් - අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා වරෙන්' යන කවියෙන් දක්නට ලැබේ.

- සැබෑ ග්‍රාමීය පරිසරයක බොදු සිසිලස දනවන ආගමික පසුබිමක් එහි නිර්මිත ය. 'කැලණි ගඟේ ඔරු යනවා බලා - වරෙන් සාධු කාර දී ඔරුවක නැගී වරෙන්' යනුවෙන් කවියා කැලණි පුද බිම සිහිපත් කෙරෙන්නේ සිතෙහි සුපහන් හැඟීම් අවදි කරවන අන්දමිනි.
- ජන කවිවලට අයත් වන තුන්සරණේ කවිවල බුදුරජාණන් වහන්සේගේ ගුණ අපූරුවට කැටි කොට ඇත. බොදු ජනයා සිරිපා වන්දනා මාන කිරීමට යන ගමනේ දී ඇති වන විඩාව සන්සිඳුවා ගනු ලබන්නේ බුද්ධ, ධම්ම හා සංඝ යන ත්‍රිවිධ රත්නයේ ගුණ ගායනා කරන ඇතුළත් තුන් සරණේ කවි ගයමින් සමනල කඳු වැටිය තරණය කරයි.

බුද්ධං සරණේ සිරස දරාගෙන
ධම්මං සරණේ සිත පහදාගෙන
සංඝං සරණේ සිවුරු දරාගෙන
ඉඤ්ඤයි තුන් සරණේ අදහාගෙන

ii. **පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට විවරණ සපයන්න.**

1) **වලහි විශ්වවිද්‍යාලය**

- ක්‍රි.ව. 475 - 775 අතර විසූ මෛත්‍රික රජවරුන් ඉන්දියාවේ බටහිර ප්‍රාන්තයේ අගනුවර වූ වලභියෙහි ඉදි කළ මහා විහාරය පසුකාලයේ අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ප්‍රචලිත වී අවසානයේ ශ්‍රාවකයාන බුදුසමයේ කේන්ද්‍රස්ථානය ලෙස වලහි විශ්වවිද්‍යාලය ගෞරවාදරයට පාත්‍ර විය.
- වලහි විශ්වවිද්‍යාලයය පිළිබඳව හියුං සියැංගේ භ්‍රමණ වෘත්තාන්තයේ මෙසේ සඳහන් වේ. 'වලභියෙහි ජනගහනය ඉතා අධික ය. රට ධනවත් ය. සියක් ලක්ෂයකට වඩා ධනය ඇති සිටු පවුල් සිය ගණනක් මෙහි වසත්, පිටරටවලින් ගෙනෙන දුර්ලභ අගනා ද්‍රව්‍යයෝ මෙහි රාශි වශයෙන් දක්නට ලැබෙත්. භික්ෂූන් 6000ක් පමණ වසන සංඝාරාම සියයක් පමණ ඇත්තේ ය. නා නා දේව භක්තිකයන්ගේ දෙවස්ථාන සිය ගණනක් ද ඇත්තා හ. බුදුරදුන් ජීවමාන කළ නොයෙක් විට මෙරටෙහි සැරි සැරූ සේක. උන් වහන්සේ නැවති සිටි තැන්වල අශෝක අධිරාජයන් විසින් ස්තූපයෝ ගොඩනංවන ලද හ.' (හියුං සියැං භ්‍රමණ වෘත්තාන්තය)
- හියුං සියැං තෙරුන්ගේ වාර්තා අනුව මෙම විශ්වවිද්‍යාලයයේ සංඝාරාම 100ක් තිබූ අතර භික්ෂූන් වහන්සේලා 6000නමක් වැඩ වාසය කළ බව.
- සම්මිතිය බෞද්ධ නිකායයේ ඉගැන්වීම් පුළුල් වශයෙන් ඉගැන්වූ වලභි විශ්වවිද්‍යාලයට දෙස් විදෙස් ශිෂ්‍යයයන් බොහෝ පිරිසක් පැමිණ අධ්‍යාපනය ලැබූහ යි ඉට්සිංගේ වාර්තාවේ සඳහන් වේ.
- අති විශාල පුස්තකාලයයක් තිබූ මෙම විශ්වවිද්‍යාලයයට පුස්තකාලයීය අරමුදලක් ද තිබූ බව ගුහසේන රජතුමා විසින් පිහිටුවන ලද සෙල්ලිපියක සඳහන් වේ.
- පුළුල් විෂයමාලාවක් ක්‍රියාත්මක වූ මෙහි සම්මිතිය නිකායික ඉගැන්වීම්වලට ප්‍රධාන තැනක් හිමි වූ අතර පොදු වශයෙන් බුද්ධ ධර්මය තුලනාත්මක ව උගන්වා ඇත.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- චතුර්වේදය, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් ආදී කොට ඇති හින්දු දර්ශන ඉගැන්වීම් ද හින්දු ධර්මශාස්ත්‍ර, දේශපාලන විද්‍යාව, වාණිජ විද්‍යාව සහ කෘෂිකර්මය, ආර්ථික විද්‍යාව, චිකිත්සා විද්‍යාව ආදී ලෞකික විෂයයන් ද ඉගැන්වීය.
- වලභි විශ්වවිද්‍යාලයයේ උපාධිධාරීන් ඉගෙනුම් කටයුතුවලින් පසු ව ස්වකීය නිපුණත්වය, රාජ්‍ය සභා ඉදිරියේ දී ප්‍රදර්ශනය කළ වග ඉට්සිං වාර්තාවේ සඳහන් වේ.
- වාද විවාද හා උත්සව අවස්ථාවන්හි දී මොවුන් සිය කුසලතා ප්‍රදර්ශනය කොට වලභි විශ්වවිද්‍යාලයයට කීර්තිය ගෙන දී ඇත.
- නාලන්දා විශ්වවිද්‍යාලයයෙන් පෝෂණය වූ එහි ආදී ගුරුවරුන් වන සුප්‍රකට ගුණමතී හා ස්ථිරමතී යන පඬිවරුන් දෙදෙනා වලභි විශ්විද්‍යාලය ගොඩනැඟූ නිසා නාලන්දා පරිපාලන රටාවට සමීප වූ පරිපාලන රටාවක් මෙහි තිබිණි.
- අධ්‍යාපනය, පරිපාලනය, පරීක්ෂණ, පුස්තකාල ආදී සියලු කටයුතු නාලන්දාවට අනුරූප වන පරිදි මෙහි ක්‍රියාත්මකවිය.
- වලභි විශ්වවිද්‍යාලයය ප්‍රධාන හීනයාන අධ්‍යාපන මධ්‍යස්ථානය ලෙස කටයුතු කළේ ය.
- ක්‍රි.ව.475 සිට 1200 දක්වා අඛණ්ඩ ව කීර්තිමත් හීනයාන විද්‍යස්ථානයක් ලෙස පැවති වලභි විශ්වවිද්‍යාලයය 13 සියවසේ සිදුවූ මුස්ලිම් ආක්‍රමණ නිසා විනාශ විය.

2) වාහල්කඩ

- පැරණි ඉන්දීය දාගැබ් වටා සිවුදෙසින් ඉදි වූ තොරණ සතර වෙනුවට ලංකාවේ දාගැබ්වල ගර්භයට සම්බන්ධ ව සතර දිසාවට මුහුණ ලා තනා ඇති කලාත්මක නිර්මාණය වාහල්කඩ ය.
- වර්තමානයේ වාහල්කඩ නමින් හැඳින්වෙන නිර්මාණ විශේෂය ශිලා ලේඛනවල සඳහන් ව ඇත්තේ ආයක හා ආදිමුඛ යනුවෙනි.
- පැරණි සිංහල කලාකරුවාගේ නිර්මාණ කෞශල්‍යය පිළිබිඹු කරන පැරණි කැටයම් රැසක් වාහල්කඩවල දක්නට ලැබේ.
- මිහින්තලේ කණ්ඨක චෛත්‍යයෙහි වාහල්කඩෙහි ඇති කැටයම් උසස් කලාත්මක අගයකින් යුක්ත බව පිළිගැනේ.
- එහි උතුරු වාහල්කඩ සම්බන්ධ උතුරු දිසාවට අයත් ගල්කුලුනු දෙකෙහි හිස මත සිංහ රූපත්, දකුණු වාහල්කඩ කුලුනු හිසමත ගව රූපත්, නැඟෙනහිර කුලුනු හිස මත ඇත් රූපත්, බටහිර කුලුනු හිස මත අශ්ව රූපත් දක්නට ලැබේ.
- ගල් කණුවල මුහුණත වර්ණ ගන්වන ලද විවිධ මල්කම් ද, කළ සහිත දඬු ද, දේව, මිනිස්, තිරිසන් හා පක්ෂි රූප ද දක්නට ලැබේ.
- මෙහි පවත්නා කල්ප වෘක්ෂ කැටයම අතිශයින් ම සිත්ගන්නා සුළු ය.
- රුවන්මැලි සෑය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනය යන ස්තූපවල කැටයම්වලින් යුතු වාහල්කඩ පැවැතී ඇත.
- වාහල්කඩ සැම ස්තූපයක ම අනිවාර්ය අංගයක් නොවීය.

3) දසරාජ ධර්ම

- *දානං සීලං පරිච්චාගං අජ්ජවං මජ්ජවං තපං*
  අක්කෝධෝ අවිහිංසෝ ච ඛන්තීව අවිරෝධනා

1. දානය - ප්‍රජා සුභසාධනය, රජු විසින් ප්‍රජා අවශ්‍යතා සපුරාලීම.
2. සීලය - ප්‍රතිපත්ති ගරුක බව, රජු සදාචාර සම්පන්න ව ක්‍රියා කිරීම.
3. පරිත්‍යාගය - මහජනයා වෙනුවෙන් කාලය, ශ්‍රමය හා භෞතික සම්පත් කැප කිරීම.
4. ඍජුබව - රජු අගතිගාමී නොවී අවංක ව ක්‍රියා කිරීම.
5. මෘදුබව - පාලකයා, මහජනයාගේ දුක් පීඩාවන් කෙරෙහි සංවේදී ව ක්‍රියා කිරීම.
6. තපස - ඉන්ද්‍රිය දමනය, පවිටු සිතිවිලිවලට වහල් නොවීම.
7. අක්‍රෝධය - ප්‍රජාව කෙරෙහි ක්‍රෝධයෙන් තොර ව මෛත්‍රියෙන් කටයුතු කිරීම.
8. අවිහිංසාව - මහජනයාට හිංසා පීඩා නොකිරීම.
9. ක්ෂාන්තිය - විරුද්ධ අදහස් මතවාද හා ක්‍රියාකාරකම් කෙරෙහි ඉවසීමෙන් කටයුතු කිරීම.
10. අවිරෝධතාව - මහජනයා සමඟත් විදේශ රජුන් සමඟත් නො ගැටී සහයෝගයෙන් ක්‍රියා කිරීම.

මෙම කරුණු ඇතුළත්ව රාජ්‍ය පාලනයට අදාළව පිළිතුර ගොනුකර තිබිය යුතුය.

4) ආගන්තුක සත්කාරය

- ආගන්තුක සත්කාරය සිංහල බෞද්ධ සංස්කෘතියේ වැදගත් සිරිතක් වශයෙන් සිදු කරන ලදී.
- ගිහි ආගන්තුක සත්කාරවලත් පැවිදි ආගන්තුක සත්කාරවලත් කිවයුතු තරම් වෙනසක් නොමැත.
- දුර බැහැර නෑදෑයන් හෝ හිතවතුන් ගෙදරට එනු දුටු විට ගෙහිමියා හෝ ගෘහණිය හෝ ඒ දෙදෙනා ම හෝ සිනාමුසු මුහුණින් පෙර මගට ගොස් පිළිගැනීම සිංහල බෞද්ධ සිරිත යි.
- ගෙදරට එන්නේ නෑදෑ හිතවතුන් නම්, දෙමාපියන් නොමැති වුනත් දරුවෝ වුව ද මේ කාර්යය කරති.
- අමුත්තන් ගෙන එන බරක් ඇතොත් එය ද භාරගෙන අමුත්තන් බරෙන් නිදහස් කිරීම ද සිරිත ය.
- නිවසට පිවිසෙන අමුත්තන් විසින් කුඩ හකුළා හිස් වැසුම් ඉවත් කර පාවහන් ඉවත් කිරීම ද බෞද්ධ සිරිතකි.
- ආචාර සමාචාර කිරීමෙන් පසු අමුත්තන්ට අසුන් පැවරේ.

PAST PAPERS WIKI

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

- බෞද්ධයන් අතර ආචාර සමාචාර විධි කීපයක් පැවැත් වේ. සමානයන් අතර පැවැත්වෙන ආචාර කිරීමේ විධිය නම් සෘජුව සිට ළමැද ඇඳිලි බැඳීම යි. නැතහොත් දෙඅත් ඔසවා ඇඳිලි බැඳීම යි.
- දෙමව්පියන්ට හා වැඩිහිටි නෑයන්ට දරු මට්ටමේ අය ආචාර කරන්නේ නමස්කාර කිරීමෙනි. මෙය පසඟ පිහිටුවා වැඳීමක් හෝ උක්කුටකයෙන් හිඳ කරන වැඳීමක් හෝ විය හැකි ය.
- දරුවෝ බොහෝ විට දෙමවුපියන්ගේ ගුරුවරුන්ගේ දෙපා සිඹ හෝ, දෙපා මත නළල තබා හෝ වැඳීමෙන් ආචාර කරති.
- ආචාර කිරීමේ දී ඊට පිළිතුරු වශයෙන් සමාචාර කිරීම ද වැදගත් ය. ඇඳිලි බැඳීමෙන් සමානයන්ට ආචාර කිරීමේ දී වැඩි වශයෙන් භාවිත වන්නේ 'ආයුබෝවන්' කීමයි. ආචාරය ලබන්නා ද එසේ ම ඇඳිලි බැඳීමෙන් 'ආයුබෝවන්' කියා සමාචාර කිරීම සිරිත ය. දරුවන් හෝ එබඳු අය විසින් දෙපා නැමඳ ආචාර කරනු ලබන වැඩිහිටි බෞද්ධයෝ 'තුණුරුවන්ගේ පිහිටයි' හෝ 'තෙරුවන් සරණයි' හෝ කියා වඳින්නාගේ හිස අත ගා සමාචාර කරති.
- කවර මට්ටමේ බෞද්ධයින්ට වුව ද ආචාර කිරීමේ දී හෝ දවසේ ප්‍රථමවරට හමුවීමේ දී හෝ 'තෙරුවන් සරණයි' යනුවෙන් ආශිංසනය කිරීම ඉතා ම ගැළපෙන්නකි. එසේ කිරීමේ දී 'තෙරුවන් සරණයි' කියා සමාචාර කිරීම හෝ ආශිංසනය කිරීම ද කළ යුතු ය.
- ආචාර කිරීමක දී සමාචාර නො කළහොත් එය ආචාර කළ තැනැත්තාට කළ නිග්‍රහයක් සේ සැලකේ.
- හරසර සහිතව පිළිගත යුතු අවස්ථාවක දී බුලත් අතක් දීමෙන් කරන ආචාර ක්‍රමය ද සිංහල බෞද්ධයන් අතර පවතී.
- ඇඳිලි බැඳීමෙන් හෝ වැඳීමෙන් ආචාර කිරීමේ සිරිත හමු වීමේ දීත් වෙන්වීමේ දීත් යන අවස්ථා දෙකේ දී ම බෞද්ධයෝ භාවිත කරති.
- ඈතින් පැමිණෙන ආගන්තුකයන්ට මූණ කට සෝදා ගැනීමට වතුර සැපයීම බෞද්ධ ගිහියන් ගේ සිරිත ය.
- වැසිකිළි ආදිය තිබෙන තැන් ද දැනුම් දෙනු ලැබේ.
- ගෙදරට පැමිණෙන අමුත්තන්නට පළමුවෙන්ම සංග්‍රහ කරන්නේ බුලතිනි. අසල්වැසි කවුරු ගෙට ගොඩ වැදුණත් බුලත් තට්ටුව පිරිනැමීම සිංහල බෞද්ධ සිරිතය.
- ඈතින් පැමිණි අමුත්තන්ට කැවිලි, සහිතව තේ පැණින් හෝ සිසිල් බීමෙන් හැකි ඉක්මණින් සංග්‍රහ කිරීමට සිංහලයෝ යුහුසුලු වෙති.
- අමුත්තන්ට උපරිම මට්ටමෙන් සංග්‍රහ කොට ආස්වාදයක් ලැබීම බෞද්ධයන්ගේ සිරිත ය. සුදු රෙදි දැමූ මේසයකට කෑම ඇර අමුත්තන්ට සංග්‍රහ කිරීම බොහෝ බෞද්ධ ගෙවල්වල පවත්නා සිරිත ය.
- කෑම මේසයේ දී සියලු දෙනාම වාඩි වූ පසු ආහාර ගැනීම ආරම්භ කිරීමත් සියලු දෙනා ම කෑම කා අවසන් වන තුරු අත නො සේදීමත් බෞද්ධ සිරිත ය. මෙය ද භික්ෂූන් වහන්සේලා අනුගමනය කිරීමකි.

- වැඩිහිටියන් ළඟින් යන විට හෝ ළඟට ආ විට අසුනෙන් නැගිටීම ද බෞද්ධ සිරිතකි.
- එසේ ම වැඩිහිටියකු සමඟ හෝ ගෞරව කළ යුත්තකු සමඟ හෝ කථා කරන විට හිස් වැස්ම අතට ගැනීම හෝ කරේ ඇති සලුව අතට ගැනීම තවමත් වැඩි වශයෙන් ගම්බද බෞද්ධයන් අතර දක්නට ලැබෙන්නකි.

(ලකුණු 05x2=10යි.)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න